ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය

# වාර්ෂික වාර්තාව

# 2017

NIOSH

National Institute of Occupational Safety and Health • Sri Lanka

# ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය

**ගරු. ඩබ්ලිව්.ඩී.ජේ.සෙනෙවිරත්න**

අමාත්‍යතුමා - කම්කරු හා වෘත්තිය සමිති සබඳතා අමාත්‍යාංශය

**ගරු රවීන්ද්‍ර සමරවීර**

රාජ්‍ය අමාත්‍ය - කම්කරු හා වෘත්තිය සමිති සබඳතා අමාත්‍යාංශය

**එස්.ඒ.එන් සරණතිස්ස**

ලේකම්, කම්කරු හා වෘත්තිය සමිති සබඳතා අමාත්‍යාංශය

සභාපති, ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය

**වෛද්‍ය එන්.සී. අමරසිංහ**

අධ්‍යක්ෂ ජනරාල්, ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය

**විගණන කමිටුව**

**වෛද්‍ය එන්.සී.අමරසිංහ** - අධ්‍යක්ෂ ජනරාල්, ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය

**පී.එම්.කේ. හෙට්ටිආරච්චි** - සභාපති, අධ්‍යක්ෂ, මුදල් අමාත්‍යාංශය

**ඩබ්ලිව්.සී. ජයතිලක** - නිරික්ෂක, විගණන අධිකාරි, විගණකාධිපති දෙපාර්තමේන්තුව

**එම්.සී. පීරිස්** - අභ්‍යන්තර විගණක, කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශය

**පී.එම්.කේ.පෙරේරා** - සහකාර අධ්‍යක්ෂ, ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය

බැංකුව - මහජන බැංකුව - නාරාහේන්පිට

## පටුන.........

| | |
|---|---|
| ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය පිළිබඳ හැඳින්වීම | 05 |
| දැක්ම, මෙහෙවර, අරමුණු | 07 |
| කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය ගරු ඩබ්ලිව්.ඩී.ජේ.සෙනෙවිරත්න මැතිතුමාගේපණිවුඩය | 08 |
| ලේකම්තුමාගේ පණිවුඩය | 09 |
| අධ්‍යක්ෂ ජනරාල්තුමියගේ පණිවුඩය | 10 |
| අධ්‍යක්ෂ මණ්ඩලය ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය | 12 |
| සංවිධාන ව්‍යුහය | 14 |
| අප ආයතනයේ හරය | 15 |
| ජාතික වෘත්තීය සුරක්ෂිතතා ආයතනයේ පොදු අරමුණු | 17 |
| ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනයේ වැඩසටහන් සහ ක්‍රියාකාරකම් | 19 |

**2017 වර්ෂයේ පැවැත්වූ පාඨමාලා , වැඩමුළු හා සම්මන්ත්‍රණ**

| | |
|---|---|
| වැඩමුළු | 19-28 |
| ➢ වෘත්තීය ආරක්ෂාව හා සෞඛ්‍ය පිළිබඳ ජාතික ඩිප්ලෝමා පාඨමාලාව | 22 |
| ➢ වෘත්තීය ආරක්ෂාව හා සෞඛ්‍ය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව | 22 |
| ➢ ඉදිකිරීම් ක්ෂේත්‍රයේ සුපරීක්ෂකවරුන් සඳහා දින තුනක පුහුණුව | 26 |
| ➢ පාරිසරික ආරක්ෂාව සහ අපද්‍රව්‍ය කළමනාකරණ පුහුණුව | 26 |
| ➢ බොයිලේරු ක්‍රියාකරවන්නන් පුහුණු කිරීම | 26 |
| ➢ කර්මාන්ත ක්ෂේත්‍රයේ හෙදියන් සඳහා වූ පුහුණුව | 26 |

- ඇඟලුම් ක්ෂේත්‍රයේ නියුතු සේවකයින් සඳහා වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය පුහුණු පාඨමාලාව 27
- උස් ස්ථානයන්හි වැඩකිරීම පිළිබඳ වෘත්තීය සුරක්ෂිතතාව සහ සෞඛ්‍ය පුහුණු පාඨමාලාව 27
- සංවෘත්ත අවකාශයේ වැඩකිරීම සඳහා සුරක්ෂිතතාව හා සෞඛ්‍ය පුහුණු පාඨමාලාව 27
- සුපරීක්ෂකවරුන් සඳහා සුරක්ෂිතතාව හා සෞඛ්‍ය පුහුණු පාඨමාලාව 27
- ප්‍රථමාධාර භාවිතය පිළිබඳ පුහුණු පාඨමාලාව 28
- තුන් දින ඉදිකිරීම් ආරක්ෂක පුහුණුව 28
- විදුලි ආරක්ෂක පුහුණු වැඩසටහන 28
- රසායනික ආරක්ෂාව පිළිබඳ එක්දින පුහුණුව 28
- OSHA 18001 පුහුණුව

**සම්මන්ත්‍රණ**

- සම්මාන උළෙල පිළිබඳ දැනුවත් කිරීමේ සැසිය 29
- සුරක්ෂිතතාව හා සෞඛ්‍ය පිළිබඳ පාසැල් දරුවන් දැනුවත් කිරීම් වැඩසටහන ආරම්භ කිරීම 29
- ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය සමුළුව 30-33
- NIOSH විසින් පවත්වනු ලැබූ පෝස්ටර් ව්‍යාපාරය 34

කර්මාන්ත සඳහා වෘත්තීය සෞඛ්‍ය හා ආරක්ෂාව පිළිබඳ කර්මාන්තය සඳහා උපදේශන සේවාව 36

උපකරණ නිවැරදි ලෙස භාවිතය පිළිබඳ උපදේශන සේවාව සැපයීම 36

වැඩ කිරීමේ යෝග්‍යතාව- නොමිලේ වෛද්‍යකඳවුරක් පැවැත්වීම 37-45

පුහුණු කරුවන් පුහුණුකිරීමේ වැඩසටහන 45-49

වෘත්තීය ආරක්ෂාව හා සෞඛ්‍ය ක්ෂේත්‍රයේ සමීකරණ සහ පර්යේෂණ 49

ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය සමාජීය වශයෙන් සිදුකල ක්‍රියාකාරකම් 53-57

තොරතුරු තාක්ෂණය මත පදනම්ව NIOSH කළමනාකරණ පද්ධතිය ස්ථාපිත කිරීම 57

2011 වසරේ සිට 2016 වසර දක්වා NIOSH ප්‍රගතිය 59-60

වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය පිළිබඳ අධ්‍යයනය සඳහා වූ පුස්තකාලය 61

ආයතනයේ මූල්‍ය ප්‍රගතිය 63-65

ගිණුම්කරණ වලට අදාල සටහන් ගිණුම්කරණ ප්‍රතිපත්ති 66-67

විගණකාධිපති වාර්තාව 68

# 01. ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය

## හැඳින්වීම

2009 අංක 38 දරණ ජාතික වෘත්තීය ආරක්ෂණ සහ සෞඛ්‍ය පිළිබඳ ආයතන පනත මඟින් කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශයේ අනුබද්ධ ආයතනයක් ලෙසින් ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය පිහිටුවන ලදී. මෙරට තුල මනා සෞඛ්‍ය හා ආරක්ෂණ ක්‍රියාමාර්ග තුළින් වෘත්තීය අනතුරු හා වෘත්තීය රෝගවැළකීම හා නිවැරදි ආරක්ෂිත ප්‍රතිපත්ති හා ක්‍රමවේදයන් පිළිපැදීම තුළින් යහපත් වැඩ පරිසර තත්ත්වයක් සෑම පුද්ගලයෙකුටම ලබාදීමට අප ආයතනය නිරතුරුවම කැපවී සිටින අතර මෙවැනි පුහුණුවක් තුළින් ප්‍රතිලාභ ලබාගත හැකි සේවක සේව්‍යය හා ඕනෑම පුද්ගලයකු සඳහා අවශ්‍ය අධ්‍යාපනයද අප විසින් ලබාදෙනු ලබයි.

නිරෝගි ශ්‍රම බලකායක් නගා සිටුවීම ඕනෑම රටක තිරසාර ආර්ථික සංවර්ධනයේ ඉතා වැදගත් අංගයක් ලෙස පිළිගනු ලැබේ.ශ්‍රී ලංකාව පුරා වෘත්තීය සෞඛ්‍ය ආරක්ෂාව සහිත වැඩකරන පරිසරයක් ක්‍රියාත්මක කිරීම මඟින් මූලික මිනිස් අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට අනුග්‍රාහ දැක්වීම අප ආයතනයේ මූලික පරමාර්ථයයි.

වර්තමානය වන විට විවිධ රාජකාරිවල නිරත වූ පුද්ගලයින් විවිධ සමාජීය, වෘත්තීයමය හේතුන් බලපා ඇති බව පර්යේෂණවලින් තහවුරු වී ඇත. එබැවින් වැඩ කිරීම නිසාවෙන් සේවක පවුල්වල සමතුලිතතාවය බිඳවැටීමට ඇති ඉඩකඩ ප්‍රමාණය බෙහෙවින් වැඩිය. එහි ප්‍රතිඵලයක් ලෙස සෞඛ්‍ය පිළිබඳ අල්ප වූ දැනුම සහ පුද්ගලයින්ගේ සමස්ත මනෝ සමාජීය තත්ත්වය යන සාධකයන් පහළ මට්ටමක පවතී. ශ්‍රී ලංකාවේ ශ්‍රම බලකාය වන මිලියන 8.7 ක් වේ. ඔවුනට මෙම තත්ත්වයන් බලපානු ලබයි. සෞඛ්‍ය සහ ආරක්ෂාව පිළිබඳ විශේෂිත වූ මාතෘකා පිළිබඳව ආයතන හා සංවිධාන අතර නිරතුරු සංවාදයන් ඇති කිරීමට දිරිගැන්වීම සහ පහසුකම් සපයයි. වෘත්තීමය තුවාල සිදුවීම හේතුවෙන් ඔවුන්ගේ සේවය සැපයීමට නොහැකි වීම නිසා ආර්ථික වශයෙන් කඩා වැටීමකට ලක්වීමට ඇති අවකාශය ඉතා වැඩීය. එබැවින් සෞඛ්‍ය සම්පන්න ශ්‍රම බලකායක් ඇති කිරීමටත් වැඩි ඵලදායිතාවක් ඇති කිරීම උදෙසා සේවා ස්ථානයේ සිදුවන අනතුරු අවම කිරීම සිදු කළ යුතුය.

වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනයේ ප්‍රධානත්වයෙන්, සෞඛ්‍ය අභියෝගයන්ට විසඳුම් සපයන සම්පත්, තොරතුරු, මෙවලම් සහ කුසලතා සැපයීම යන මාතෘකා ඔස්සේ විශේෂඥ පුහුණු වැඩසටහන් පවත්වනු ලබයි. එමෙන්ම ජාතික, ජාත්‍යන්තර ආයතන විශ්වවිද්‍යාල හා වෙනත් පිහිටුවා ඇති එවැනි සංවිධාන සමග සම්බන්ධීකරණය කිරීම මගින් සම්බන්ධතා ජාල ගොඩනගමින් වෘත්තීය සෞඛ්‍ය හා සුරක්ෂිතතා විෂය දියුණු කිරීම හා පර්යේෂණ වැඩි දියුණු කිරීම සිදුකරනු ලබයි.

අප ආයතනය මගින් වෛද්‍ය පරීක්ෂණ, පාරිසරික සමීක්ෂණ, ආතති කළමනාකරණ පුහුණු

වැඩසටහන් විශාල කලාපීය පරිමාණයක් ආවරණය වන පරිදි පැවැත්වීම, සම්මන්ත්‍රණ සහ ජාලකරණ, තිරසාර වැඩ පිළිවෙත් සඳහා පහසුකම් සපයයි.

NIOSH ආයතනයක් ලෙස නිරන්තරයෙන් අපක්ෂපාතීව, ලෝක මට්ටමේ වෘත්තීය සෞඛ්‍ය සුරක්ෂිතතා සේවාවක් සහ වෘත්තීය අනතුරු හා රෝග අවම කිරීම අරමුණු කරගත් ආරක්ෂිත හා සෞඛ්‍ය සම්පන්න වැඩ පරිසරයක් නිර්මාණය කිරීම සහ ස්වයං මූල්‍ය සම්පාදන ආයතනයක් ලෙස ස්ථාපිත කිරීම හා පවත්වාගෙන යාම ඉලක්ක කරගනිමින් සිදු කෙරේ.

ඉහත සඳහන් ක්‍රියාකාරිත්වයන් ඉතා සාර්ථක ලෙස ඉටුකරමින් උපරිම තෘප්තියක් පාරිභොගිකයින්හට ලැබෙන ලෙස ඵලදායී සේවාවක් සැපයීමට හැකියාව ලැබීම අප ඉතාමත් තෘප්තියට සහ සතුටට පත්වන්නෙමු. 2009 අංක 38 දරණ NIOSH පනතෙහි සඳහන් වන අරමුණු සාක්ෂාත් කර ගැනීම ඉතා කෙටි කාලයක් තුළ ලබාගැනීමට හැකි වූ බව පසු විමරම් තුළින් පැහැදිලි වනු ඇත. එමෙන්ම, බොහෝ ආයතනයන් ජාතික වෘත්තීය සුරක්ෂිතා හා සෞඛ්‍ය ආයතනයේ සේවාවන් ලබාගෙන ඇත. මෑත අතීතයේ දී, එම ආයතනයන්හි සහයෝගය ඇතිව අදාළ ආයතනවල සේවකයින්ගේ සෞඛ්‍ය සුරක්ෂිතතාව හා සුරක්ෂිතභාවය සම්බන්ධයෙන් දැනුවත් කිරීම විවිධ වැඩසටහන් මගින් සිදුකෙරේ. මෙම වසරේ දී අපගේ සේවාවන්ගේ ගුණාත්මකභාවය වැඩි දියුණු වී ඇති බැවින් බොහෝ කර්මාන්ත අතර සිදුවන වෘත්තීය අනතුරු හා රෝග අවම කිරීමට විශාල දායකත්වයක් සපයා ඇත.

නිදහස් වෙළෙඳ කලාපයේ මෙන්ම කර්මාන්ත අංශයේ, රෙදිපිළි හා ඇඟලුම් නිෂ්පාදන ක්ෂේත්‍රය, කාර්මික අංශය වැනි සියළුම කර්මාන්ත වල NIOSH සන්නාමය “NIOSH Brand" යනුවෙන් හඳුන්වා දීමය. එමෙන්ම ඔවුන්ගේ ඉල්ලීම මත සේවකයාගේ ආරක්ෂාව හා සෞඛ්‍ය වැඩි දියුණු කිරීම සඳහා ඉතා සාර්ථක සේවාවක් සැපයීම අප විසින් සිදු කරනු ලබයි.

නිවැරදිව යන්ත්‍ර හා මෙවලම් භාවිත කිරීම පිළිබඳව අප පාඨමාලා තුළින් මූලික වශයෙන් ඉගැන්වීම් කටයුතු සිදුකරනු ලැබේ. එබැවින් රැකියා ස්ථානයේ අවධානම් සහගත තත්ත්වය පහවී සුරක්ෂිත වැඩ පරිසරයක් තුල සතුටින් රැකියාවල නිරතවන වෘත්තිකයන් බිහිවීම අප ආයතනයේ ප්‍රධාන අරමුණ හා ඉලක්කය වේ.

# ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනයේ

# දැක්ම හා මෙහෙවර

දැක්ම :- “සැමට වෘත්තීය සුරක්ෂිතතාව සෞඛ්‍ය හා සුභසාධනය ලබාදීම”

මෙහෙවර:- “සේවා ස්ථානවල සුරක්ෂිතතාවය හා සෞඛ්‍ය සහතික කරලීම සහ ඵලදායිතාව වර්ධනය කිරීම සඳහා සියළු ආකාරයේ රැකියා උපද්‍රවයන් වළක්වාලීම පිණිස අධ්‍යාපනය පුහුණුව හා පර්යේෂණය තුළින් ත්‍රෛයිපාර්ශවීය කොටස් කරුවන් සවිබලගැන්වීම.”



**කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශයේ අමාත්‍යතුමාගේ පණිවුඩය.**

2009 අංක 38 දරණ ජාතික වෘත්තීය ආරක්ෂණ සහ සෞඛ්‍ය පිළිබඳ ආයතන පණත මඟින් කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශයේ අනුබද්ධ ආයතනයක් ලෙසින් ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය පිහිටුවන ලදී. එමෙන්ම 2005 අප්‍රේල් 28 වන දින පිහිටුවන ලද ව්‍යවස්ථාපිත සහයෝගිතා ආයතනයකි. ශ්‍රී ලංකාව තුළ නිසි සෞඛ්‍ය හා ආරක්ෂණ ක්‍රමවේදයන් වැඩිදියුණු කිරීම හා දැනුවත් කිරීම් වැඩිදියුණු කිරීමට ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය කැපවී කටයුතු කර ඇත. දැනුවත් කිරීමේ පුහුණුව, වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය පිළිබඳ පර්යේෂණ, නවීකරණය කරන ලද තොරතුරු බෙදා හැරීම, උපදේශන සේවා සැපයීම අපගේ වගකීමයි. මෙම ආයතනය විසින් සිදුකරන අනෙකුත් සියලුම අංශවල සේවකයන් වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය පිළිබඳ දැනුවත් කිරීම් හා පුහුණු කිරීම් කටයුතු මා විසින් අගය කරන්නෙමි.

පසුගිය වසර කිහිපය තුළ සිදුකරන ලද ක්‍රියාකරකම් මගින් ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය සම්පන්න ශ්‍රම බලකායක් ඇති කිරීමේ කැපවීම හා ජාතික වෘත්තීය සුරක්ෂිත පරිසරයක් ගොඩ නැගිමට කැප වූ ප්‍රජාව මම අගය කරමි.

ජාතික වෘත්තීය සුරක්ෂිතතා ආයතනයේ අභිවෘද්ධිය උදෙසා අනුපමේය මෙහෙයක් ඉටුකරන ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්තුමිය ඇතුළු සියලුම කාර්යය මණ්ඩලයට මාගේ කෘතඥතාවය පුදකර සිටිමි.

**ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න.**

**අමාත්‍ය කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය.**

**කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශ ලේකම්තුමාගේ පණිවුඩය.**



2017 වසරේ දී ජාතික වෘත්තීය සුරක්ෂිතතා ආයතනය විසින් ශ්‍රී ලංකා සේව්‍ය, සේවක පක්ෂ වෙත ඉටුකරන ලද සේවාවන් හා එහි සංවර්ධනයේ ප්‍රගතිය දැක්වෙන මෙම වාර්ෂික වාර්තාවට පණිවුඩයක් නිකුත් කිරීමට ලැබීම මා භාගයක් කොට සලකමි. ශ්‍රී ලංකාව තුළ වෘත්තීය සෞඛ්‍ය හා සුරක්ෂිතතාවයෙන් යුක්ත ආරක්ෂිත පරිසරයක් බිහිකිරීමට කැපවීම මා කෘතඥ පූර්වකව ස්තූතිවන්නෙමි.

සරල වැරැද්දකින් සිදුවිය හැකි බරපතල ප්‍රතිවිපාක පිළිබඳව කර්මාන්තයන්හි ප්‍රජාව දැනුවත් කරමින් ඔබ ආයතනය සිදුකරනු ලබන සේවාවව ඉතා ප්‍රශංසනීය වේ. එමෙන්ම, වෘත්තීය සුරක්ෂිතතා නිලධාරීන් වර්ෂයකට 60කට අධික පිරිසක් බිහිකරමින් කර්මාන්තයන්හි සේවය කරන සේවකයන්ගේ වෘත්තීය සුරක්ෂිතතාවය තහවුරු කිරීමට ගනු ලබන පියවර ඉතා සතුටුදායකය.

ජාත්‍යයන්තර කම්කරු සංවිධානය විසින් ප්‍රකාශයට පත්කරන ලද ගොලීය ඇස්තමේන්තුවට අනුව වසරකට මිලියන 2.3ක මරණ සංඛ්‍යාවක් වෘත්තීය අනතුරු නිසා සිදුවන බව හේතු සාධක ඇතිව ගනන් දක්වා ඇත. වැඩිම මරණ අනුපාතය මිලියන 2ක් වෘත්තීය අනතුරු නිසා සිදු වූ අතර ඉතිරි පිරිසට තුවාල සිදු විය. රැකියා තක්සේරු කිරීම් හා රෝගාබාධ සඳහා වන ආර්ථික පිරිවැය, රටේ ඇස්තමේන්තු වල දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 1.8ත් 6ත් අතර වන අතර එය සාමාන්‍යයෙන් 4%කි. අනතුරු සිදු වීමට නොයෙකුත් හේතු සාධකයන් බලපෑ හැක. ඒ අනුව සේවකයාගේ පවුලේ තත්ත්වය, නිවසේ පරිසරය, භාවිත කරන උපකරණ වර්ග සහ භාවිත කරන ද්‍රව්‍ය යනාදිය මඟින් අනතුරු හෝ තුවාල සිදුවිය. මෙම තත්ත්වයන්ගෙන් සිදුවන අනතුරු අවම කිරීම උදෙසා ජාතික වෘත්තීය සුරක්ෂිතතා ආයතනය සිදුකරන කැපවීම මා විසින් අගය කරමි. මෙම හේතු සාධකයන්ට අමතරව වෙනත් කොන්දේසි ද අනතුරු සිදු වීම සඳහා බලපෑම් කල හැක. ඒ අනුව මානසික පීඩනය, අඩු ආලෝකය, ආරක්ෂිත උපකරණ නොමැති වීම, උපකරණ භාවිතය පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් නොමැතිවීම, අඩු අධ්‍යාපන තත්ත්වය යනාදි සාධකයන් නිසා වෘත්තීය අනතුරු සිදු විය හැකි බැවින් අනතුරු අවම කිරීම හා සියලු සේවකයන්ගේ සුරක්ෂිතතාවය වර්ධනය කිරීම උදෙසා ඔබ ආයතනයෙන් සිදුකරන සේවය ඉතා අගය කරන්නෙමි.

අවසාන වශයෙන් ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය විසින් සිදුකරනු ලබන සේවාව මා අගය කොට සලකමි. ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනයේ සියලු කාර්ය මණ්ඩලයට මගේ කෘතඥතාවය පුදකරන්මි. මෙරට තුළ වෘත්තීය සුරක්ෂිතතාවයෙන් යුක්ත පරිසරයක් බිහිකිරීම උදෙසා සිදුකරනු ලබන මෙහෙය ඇගයීමට කැමැත්මි.

**එස්. ඒ.එන් සරණතිස්ස.**

**ලේකම්.**

**කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය.**

**සභාපති, ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය**

**ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්තුමියගේ පණිවුඩය.**



2009 අංක 38 දරණ ජාතික වෘත්තීය ආරක්ෂණ සහ සෞඛ්‍ය පිළිබඳ ආයතන පණත මඟින් කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශයේ අනුබද්ධ ආයතනයක් ලෙසින් ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය පිහිටුවන ලදී. එමෙන්ම 2005 අප්‍රේල් 28 වන දින පිහිටුවන ලද ව්‍යවස්ථාපිත සහයෝගිතා ආයතනයකි. මෙරට තුළ මනා සෞඛ්‍ය හා ආරක්ෂණ ක්‍රියාමාර්ග තුළින් වෘත්තීය අනතුරු හා වෘත්තීය රෝග වැළකීම හා නිවැරදි ආරක්ෂිත ප්‍රතිපත්තියක් හා ක්‍රමවේදයන් පිලිපැදීම තුළින් යහපත් වැඩ පරිසර තත්ත්වයක් සෑම පුද්ගලයෙකුටම ලබාදීමට අප ආයතනය නිරතුරුවම කැපවී සිටින අතර මෙවැනි පුහුණුවක් තුළින් ප්‍රතිලාභ ලබාගත හැකි සේවක සේව්‍යය හා ඕනෑම පුද්ගලයකු සඳහා අවශ්‍ය අධ්‍යාපනය ද අප විසින් ලබාදෙනු ලබයි. වෘත්තීය සුරක්ෂිතතාව සහ සෞඛ්‍ය පිළිබඳ ජාතික ආයතනයේ ඉලක්කය වූ කලී ස්වයං මූල්‍ය සම්පාදිත ආයතනයක් වශයෙන් අපක්ෂපාතීව ජාත්‍යයන්තර මට්ටමින් වෘත්තීය සුරක්ෂිතාව හා සෞඛ්‍ය සේවා සැලසීම හා ආරක්ෂාකාරී වූත් සෞඛ්‍යයට හිතකර වැඩ පරිසරයක් ශ්‍රී ලංකාව තුල නිර්මාණය කිරීම සහ ආරක්ෂිත සංස්කෘතිකයක් ශ්‍රී ලංකාව තුල ඇති කිරීමය. සියලු ජනතාව සඳහා ආරක්ෂිත වැඩ පරිසරයක් නිර්මාණය කිරීමත්, නඩත්තු කිරීම හා පවත්වාගෙන යාමත් නිසි සෞඛ්‍ය හා ආරක්ෂක ක්‍රමවේදයක් නිර්මාණය කිරීමටත් ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය කැපවී කටයුතු කරනු ලබයි.

ආයතනයේ අරමුණ වන්නේ ස්වයං මූල්‍ය සම්පාදන ආයතනයක් වන අතරම කර්මාන්තයන් සඳහා ලෝක මට්ටමේ වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය සේවාවක් සැපයීමයි. අපගේ සියලුපාර්ශවකරුවන්ට වෘත්තීය සුරක්ෂිතතාව සහ සෞඛ්‍ය තොරතුරු ලබාදීම සඳහා ජාතික සුරක්ෂිතතා ආයතනය ප්‍රමුඛත්වය ගෙන කටයුතු කරනු ලැබේ.

වෘත්තීයමය රෝගාබාධ වැලැක්වීම, වෘත්තීය හදිසි අනතුරු, වෘත්තීය සුරක්ෂිතතාව සහ බලපෑම් කෙරෙහි බලපෑම් කිරීම, වෘත්තීමය අනතුරු අවම කිරීම, ඉහළ මට්ටමේ වෘත්තීය සෞඛ්‍යාරක්ෂාව සහ ආරක්ෂණ පිළිවෙත් පිළිබඳව පුහුණුවක් ලබාදීම සහ රෝගාබාධ අවමකිරීමේ වගකීම, සිසුන් සඳහා අවශ්‍ය වන වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය පුහුණුව සැපයීම, කර්මාන්තයට සේවා කටයුතු සඳහා යෝග්‍යතාව සැපයීම, NIOSH විසින් සිදුකරනු ලබන සේවා අතර ප්‍රධාන වේ.

අප ආයතනය විසින් සංවිධාන සඳහා ලබාදෙනු ලබන පුහුණුවෙහි සේවක සේවිකාවන් වැඩකරන සේවා ස්ථානයේ වැඩකරන අතර වාරයේ අනෙකුත් සේවකයින්ගේ ආරක්ෂාව සලසා දිය යුතු ආකාරය පිළිබඳ මනා පුහුණුවක් ඔවුනට ලබාදේ. ඒ අනුව වැඩපල ස්ථානයේ වෘත්තීය අනතුරු හා උවදුරු කලින් හඳුනාගැනීමටත්, අවධානම් ඇති ස්ථාන හඳුනාගැනීමටත් අවශ්‍ය පුහුණුව ලබාදෙනු ලැබේ.

අප අපෙගේ සේවාවන් සැපයීමේ දී හොඳම විද්‍යාත්මක පුහුණුව, හොඳම විද්‍යාත්මක දැනුම සහ සම්පත් භාවිත කරන්නෙමු. අපගේ සේවාවන් සැපයීමේ දී අත්දැකීම් ඇති අතිශයින්ම සුදුසුකම් ලබන විශේෂඥයින් සවිබල ගන්වමින් අපගේ සේවාවන් හොඳම ගුණාත්මක භාවය පවත්වාගෙන යති. ශ්‍රී ලාංකීය කර්මාන්තයන්හි අනාගත අභිවෘද්ධිය උදෙසා අත්‍යවශය වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය පිළිබඳ තත්ත්ව ආරක්ෂණ මෙහෙයුම් සේවා සපයනු ලබයි.

දේශීය කර්මාන්ත, සේවා යෝජකයින්, සේවකයින්, අන්තර්ජාතික සංවිධාන, විශ්වවිද්‍යාල සහ වෘත්තීය ප්‍රජාවන් සමඟ ගෝලීය සංකල්පවලට අනුකූලව සම්බන්ධතා ඇතිව කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය නියෝජනය කරන එකම රාජ්‍ය ආයතනයයි. තව ද අපි කර්මාන්ත, සේවා යෝජකයින් සහ අනෙකුත් පාර්ශවකරුවන් සමඟ කටයුතු කරන අතර ඔවුන් සමඟ සබඳතා පවත්වාගෙන යෑමට කටයුතු කරන්නෙමු.

**වෛද්‍ය එන්. සී. අමරසිංහ**
**අධ්‍යක්ෂ ජනරාල්**
**ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය**

**ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය**

අධ්‍යක්ෂක මණ්ඩල සමාජිකයින්



සභාපති

එස්. ඒ. එන් සරණතිස්ස මහතා

ලේකම්,

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය

## සමාජිකයින්



වෛද්‍ය එන්. සී. අමරසිංහ මිය

අධ්‍යක්ෂ ජනරාල්

ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය



රෝහිත ප්‍රනාන්දු මයා

කොමසාරිස් - කාර්මික සුවස්ථතා අංශය

කම්කරු දෙපාර්තමේන්තුව



මහාචාර්ය අජිත් ද අල්විස් මයා

රසායනික ඉංජිනේරු පීඨය ,මොරටුව විශ්වවිද්‍යාලය



වෛද්‍ය ඉනෝකා සුරවීර
ප්‍රජා විශේෂඥ වෛද්‍ය
සෞඛ්‍ය අමාත්‍යාංශය



ආචාර්ය ඩබ්ලිව්. බී. විජේරත්න මයා


ආහාර හා කෘෂිකර්ම අමාත්‍යාංශය



පී. එම්. කේ. හෙට්ටිආරච්චි මයා
අධ්‍යක්ෂ
මුදල් අමාත්‍යාංශය

- එච්. එන්. පී. හෙට්ටිකන්දගේ මයා
- ඩබ්. ඩී. බී. වන්නිආරච්චි මයා
- ඩී. එම්. පී. බී. දිසානායක මයා
- ඩබ්. ඒ. ඩී. වී. කුමාර වීරසිංහ මයා
- එච්. අයි. රූපසිංහ මයා
- ඩී. ඩී. එස්. කේ. දසනායක මයා
- පී. බී. මල්ලවආරච්චි මයා

# සංවිධාන ව්‍යුහය


අධ්‍යක්ෂ ජනරාල්
අධ්‍යක්ෂ(සෞඛ්‍ය හා සුවස්ථතා)
අධ්‍යක්ෂ(සුරක්ෂිත තා)
සහකාර අධ්‍යක්ෂ (සෞඛ්‍ය)
සහකාර අධ්‍යක්ෂ (ස්වස්ථතා)
සෞඛ්‍ය හා සුරක්ෂිතතා නිලධාරි
වෘත්තීය සුරක්ෂිතතා නිළධාරි
සහකාර අධ්‍යක්ෂ (පරිපාලන)
සහකාර අධ්‍යක්ෂ (මුදල්)
සහකාර අධ්‍යක්ෂ (සිවිල්)
සහකාර අධ්‍යක්ෂ කාර්මික
සහකාර අධ්‍යක්ෂ (ඉලෙක්ට්‍රිකල් හා ඉලෙක්ට්‍රොනික්)
නීති සම්පාදක නිළධාරි
පුස්තකාලාධිපති
සම්බන්ධීකරණ නිලධාරි
කලමණාකරණ සහකාර තාක්ෂණිකl (2)
කලමණාකරණ සහකාර තාක්ෂණික නොවන (8)
රියදුරු(2)
කාර්යාල සහයක (3)

**අප ආයතනයේ හරය**

**අප ආයතනයේ හරය මූලික අරමුණුවලට සමගාමීව**

**1 කැපවීම**

NIOSH හි සියලුම කාර්ය මණ්ඩල සමාජිකයින් උපරිම මට්ටමේ තම කැපවීම ලබාදෙන්නේය.

**2 පාරදෘශ්‍යතාව**

වැඩ කටයුතු හා සම්බන්ධ ක්‍රියා පිළිවෙල හා පද්ධති නිසියාකාරව පවත්වාගෙන යමින් විනිවිදතාවයකින් යුක්තව කාර්යක්ෂමව කටයුතු කරනු ලබයි.

**3 කණ්ඩායම් වැඩ**

සියලුම කාර්ය මණ්ඩලය අරමුණු සාක්ෂාත් කර ගැනීමට කණ්ඩායමක් ලෙස දැඩි කැපවීමෙන් කටයුතු කරනු ලබයි.

**4 වෘත්තීමය හා පෞද්ගලික අවංක භාවය**

NIOSH කාර්ය මණ්ඩලය ගෞරවනීය සේවාවක් සැපයීම තුළ පක්ෂපාතීත්වය සහ අවංකභාවය ප්‍රදර්ශනය කරනු ලබයි.

**6 ගුණත්වය**

සියලු නිෂ්පාදන හා සේවාවන් NIOSH හි ගුණාත්මකභාවය මත රැදි පවති.

**7 තාක්ෂණික පවීණතාවය**

සියලුම කාර්යය මණ්ඩලය තාක්ෂණික ප්‍රවීණතාවයෙන් යුක්තය.

## 8 නායකත්වය

සියලුම කාර්යමණ්ඩය නායකත්ව කුසලතාවයන් විදහා දක්වනු ලබයි.

## 9 සන්නිවේදනය

සියලුම කාර්ය මණ්ඩලය ඵලදායි ලෙස සන්නිවේදන කටයුතු ඉතා කාර්යශූරත්වයෙන් කරනු ලබයි.

## 10 මානව සම්පත් සංවර්ධනය

අඛණ්ඩ මානව සම්පත් සංවර්ධනය සඳහා පෞද්ගලික කුසලතාවයන් සංවර්ධනය කිරීම නිරන්තරයෙන් කරනු ලබන්නේය.

## ජාතික වෘත්තීය සුරක්ෂිතතා ආයතනයේ පොදු අරමුණු

1. ශ්‍රී ලංකාවේ හෝ විදේශීය විශ්වවිද්‍යාලයක් සමග සහයෝගීතාවයෙන් හෝ ආයතනය විසින් වෘත්තීය ආරක්ෂණය හා සෞඛ්‍ය පිළිබඳව දැනුම, පුහුණුව ලබාගැනීමට අපේක්ෂාවෙන් සිටින සේවා නියුක්තිකයන්ට, නිවැසියන්ට, සේවකයන්ට හෝ වෙනත් යම් තැනැත්තෙකුට දැනුවත් කිරීම හා අවශ්‍ය පුහුණුව ලබාදීම සහ එකී පුහුණුව හෝ දැනුවත් කිරීමේ වැඩසටහන සම්පූර්ණ කිරීමෙන් පසුව සහතික පත්‍ර හෝ ඩිප්ලෝමා සහතික ප්‍රදානය කිරීම.

2. උපකරණ, අනතුරුදායක ද්‍රව්‍ය, භෞතික, රසායනික හෝ ජීව විද්‍යාත්මක ද්‍රව්‍ය හෝ නිෂ්පාදන හෝ වෙනත් යම් යම් අනතුරුදායක ද්‍රව්‍ය නිවැරදිව භාවිතකරන ආකාරය හා හඳුනාගත් අනතුරුවලින් වැළකීම පිළිබඳ අවශ්‍ය උපදේශන සහ ප්‍රායෝගික සේවාවන් සැපයීම

   (1) වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය සම්බන්ධයෙන් ප්‍රමිතීන්, නීති සැපයීම, පුහුණු සහ මාර්ගෝපදේශ සම්බන්ධයෙන් ව්‍යවස්ථාමය නියමයන් පිළිබඳ අමාත්‍යවරයාට උපදෙස් ලබාදීම.

   (11) වැඩ පිළිබඳ සීමා කිරීමකට, තහනමකට සීමා කිරීමකට හෝ අධීක්ෂණයකට යටත් කරනු ලැබීමකට නිරාවරණය වන්නාවූ ද්‍රව්‍ය සහ කාරක ඇගැයීම හා නිශ්චය කිරීම.

3. වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍යය පිළිබඳ තොරතුරු රැස් කිරීම, සකස් කිරීම, බෙදා හැරීම සහ ප්‍රසිද්ධ කිරීමේ කටයුතු සිදුකිරීමට භාර ගැනීම සහ එයට සහයෝගය දැක්වීම.

4. ශාස්ත්‍රීය සම්මන්ත්‍රණ, දේශණ, වැඩමුළු, සම්මන්ත්‍රණ වැනි වැඩසටහන් සංවිධානය කිරීම හෝ එවැනි වැඩසටහන්වලට අනුග්‍රහය දැක්වීම සහ වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍යය පිළිබඳ ලිපි පල කිරීම.

5. වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය පිළිබඳ අන්තර් අමාත්‍යාංශ ව්‍යාපෘති, වැඩසටහන් හා ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය කිරීම.

6. වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය වැඩිදියුණුකරමින් පුහුණු කටයුතු ප්‍රවර්තනය උදෙසා පුස්තකාල සහ රසායනාගාර ස්ථාපිතකර පවත්වාගෙන යෑම.

7. පර්යේෂණාගාර හා විශේෂ රසායනාගාර වැඩිදියුණු කිරීම.

8. වෘත්තීය ආරක්ෂාව හා සෞඛ්‍ය ක්ෂේත්‍රයට අදාල ජාතික හා ජාත්‍යන්තර ආයතන, විශ්වවිද්‍යාල, හෝ වෙනත් වෘත්තීය සෞඛ්‍ය ක්ෂේත්‍රයට අදාළ ආයතන සමඟ ජාල පිහිටුවීම.

9. වෘත්තීය සෞඛ්‍ය ක්ෂේත්‍රයට අදාළ ජාතික ප්‍රමිතීන් සකස් කිරීම.

## වර්ෂය තුළ අපගේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා NIOSH හි උපාය මාර්ග

- වෘත්තීය සෞඛ්‍ය ආරක්ෂාව පිළිබඳ ජාතික ප්‍රතිපත්ති සකස් කිරීම හා කාලීනව යාවත්කාලීන කිරීම සඳහා රජයට උපදෙස් දීම.
- රසායනික භාවිතය, ඉදිකිරීම් කටයුතුවල ආරක්ෂාව, වෘත්තීය අනතුරු හා රෝග වැළැක්වීම, පාරිසරික ආරක්ෂාව, අපද්‍රව්‍ය කළමණාකරණය හා ආතතිය කළමනාකරණය වැනි ඉලක්කගත වැඩසටහන් ඔස්සේ වෘත්තීය සුරක්ෂිතතාව සහ සෞඛ්‍ය පිළිබඳ දැනුවත් කිරීම් වැටසටහන් පැවැත්වීම මගින් වෘත්තීයම අබාධ හා රෝග අවම කිරීම සඳහා කර්මාන්තයන්ට සහාය වීම.
- වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය අවධානම ඇගයීම සිදු කිරීම මගින් වැඩ පරිසරය වැඩිදියුණු කිරීම සඳහා කර්මාන්තයන්ට සහය වීම සහ වැඩිදියුණු කිරීම් සඳහා උපදෙස්, විසඳුම් සහ නිර්දේශ සැපයීම.
- පර්යේෂණ හා සංවර්ධන අරමුදල් ඇති කිරීම, ශක්තිමත් පර්යේෂණ කණ්ඩායමක් සැකසීම, වෘත්තීය සුරක්ෂිතතාව සහ සෞඛ්‍ය සම්බන්ධ පර්යේෂණ හා සමීක්ෂණ පැවැත්වීම, පර්යේෂණ පත්‍රිකා ප්‍රකාශයට පත්කිරීම සහ දේශීය සහ විදේශීය විශ්වවිද්‍යාල සමඟ සම්බන්ධ වී පර්යේෂණ සිදු කිරීම සඳහා වෘත්තීය සුරක්ෂිතතා සෞඛ්‍ය ආයතනය මඟින් මඟ පෙන්වීම සිදුකරනු ලැබේ.
- වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳ කර්මාන්ත ක්ෂේත්‍රයේ ඇති හොඳ පුරුදු ඇගයීමට හා ඇගයීම සඳහා දෙවන ජාතික වෘත්තීය ආරක්ෂාව සහ සෞඛ්‍ය සම්මාන තරගාවලිය සංවිධානය කිරීම හා වසර දෙකකට වරක් සම්මාන උළෙල සංවිධානය කිරීම.
- දෙවන ජාතික වෘත්තීය ආරක්ෂාව සහ සෞඛ්‍ය විශිෂ්ඨතා සම්මාන උළෙල සංවිධානය කිරීම හා නැවත වෘත්තීය සුරක්ෂිතතා සෞඛ්‍ය කර්මාන්තයේ හොඳම ක්‍රියාකාරි භාවිතයන් ඇති ආයතනය ඇගයීමට ලක් කිරීම.
- දැනුවත්භාවය වර්ධනය කිරීම සහ වෘත්තීය සුරක්ෂිතතාව පිළිබඳ වෘත්තීයවේදීත්වය වෘත්තීයමභාවය ශක්තිමත් කිරීම සඳහා විවිධ පුහුණු වැඩසටහන් පැවැත්වීම.
- ජාතික වෘත්තීය සුරක්ෂිතතාව සහ සෞඛ්‍ය ප්‍රමිති හා රෙගුලාසි සංවර්ධනය කිරීම.
- ඕනෑම භෞතික රසායනික හා ජීව විද්‍යාත්මක කාරක හෝ නිෂ්පාදන වලින් සේවකයන් ආරක්ෂා කිරීම සඳහා පෞද්ගලික ආරක්ෂක උපකරණ නිසි ලෙස භාවිතය පිළිබඳ ප්‍රායෝගික ප්‍රදර්ශන පැවැත්වීම.
- 2016 වර්ෂයේ පැවති ජාතික වෘත්තීය සුරක්ෂිතතා සහ සෞඛ්‍ය සම්මන්ත්‍රණය සඳහා නියෝජිතයින් 450කට අධික සංඛ්‍යාවක් සහභාගී වීම.

## 2018 වර්ෂය තුළ ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය විසින් පවත්වනු ලැබූ වැඩසටහන් හා ක්‍රියාකාරකම්.

| | වැඩසටහන | කාල පරිච්ඡේදය |
|---|---|---|
| තුන්වන මට්ටම | වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව | 2017.03.26 කණ්ඩායම 13<br>2017.07.02 කණ්ඩායම 14<br>2017.11.26 කණ්ඩායම 15 |
| දෙවන මට්ටම | වෘත්තීය ආරක්ෂාව හා සෞඛ්‍ය පිළිබද ජාතික ඩිප්ලෝමා පාඨමාලාව | 2017.01.07 කණ්ඩායම 20<br>2017.01.25 කණ්ඩායම 21<br>2017.02.03 කණ්ඩායම 22<br>2017.07.05 කණ්ඩායම 23<br>2017.08.12 කණ්ඩායම 24 |
| තුන්වන මට්ටම | පාරිසරික ආරක්ෂාව, කසල කළමනාකරණය හා ආපදා කළමනාකරණය සදහා සුදානම් වීම දින 10ක වැඩසටහන | |
| පළමු මට්ටම | ඉදිකිරීම් ආරක්ෂාව දෙදින වැඩසටහන | 2017.01.11 සහ 12 |
| පළමු මට්ටම | කසල කළමනාකරණ එක්දින වැඩසටහන | 2017.01.20 |
| පළමු මට්ටම | බෝයිලේරු ක්‍රියාකරවන්නන් සදහා සුරක්ෂිතතාව හා සෞඛ්‍ය පුහුණු පාඨමලාව | 2017.02.09 |
| පළමු මට්ටම | කර්මාන්ත ආශ්‍රිත සේවයේ නියුතු හෙදියන් සදහා හෙද පුහුණු එක්දින පාඨමාලාව | 2017.02.28 |
| පළමු මට්ටම | රෙදිපිළි ආශ්‍රික කර්මාන්ත සේවයේ නියුතු සුපරීක්ෂකවරුන් සදහා සුරක්ෂිතතාව හා සෞඛ්‍ය පුහුණු පාඨමාලාව | 2017.03.20 සහ 21 |
| පළමු මට්ටම | කර්මාන්ත ආශ්‍රීත අනතුරු දායක තත්ත්වයන් හදුනාගැනීමේ එක් දින පුහුණු පාඨමාලාව | 2017.03.28 |
| පළමු මට්ටම | සීමා සහිත අවකාශයේ වැඩ කිරීම සදහා සුරක්ෂිතතාව හා සෞඛ්‍ය පුහුණු පාඨමාලාව | 2017.05.16 |
| පළමු මට්ටම | සුපරීක්ෂකවරුන් සදහා සුරක්ෂිතතාව හා සෞඛ්‍ය පුහුණු පාඨමාලාව | 2017.06.30 |


| | | |
|---|---|---|
| පළමු මට්ටම | ප්‍රථමාධාර පිළිබඳ වැඩසටහන | 2017.07.02/03/04 |
| පළමු මට්ටම | ඉදිකිරීම් ආරක්ෂාව පිළිබඳ තෙදින වැඩවැඩසටහන | 2017.07.05/06/07 |
| පළමු මට්ටම | විදුලිආරක්ෂාව පිළිබඳ දෙදින වැඩමුලුව | 2017.07.06/07 |
| පළමු මට්ටම | රසායනික ආරක්ෂාව පිළිබඳ එක් දින පුහුණු පාඨමාලාව | 2017.07.18 |
| පළමු මට්ටම | OSHA 18001, එක් දින වැඩසටහන | 2017.08.19 |

**විශේෂිත වැඩසටහන්**

| | | |
|---|---|---|
| දෙවන මට්ටම | ගංවතුරෙන් අපදාවට පත් අවතැන් වූවන් සඳහා වූ වෛද්‍ය වැඩසටහන - රත්නපුර දිස්ත්‍රික්කය | 2017.06.31 |
| දෙවන මට්ටම | රැකියාව නිසා අත්පා අහිමි වූවන් නැවත සමාජගත කිරීමේ වැඩසටහන | 2017.07.20 |
| දෙවන මට්ටම | ජපන් පාඨමාලාව | 2017.06.05 |
| දෙවන මට්ටම | පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන - මඩකලපුව | 2017.07.27/28/29/30/31 |
| දෙවන මට්ටම | පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන - වව්නියාව | 2017.08.23/24/25/26/27 |
| දෙවන මට්ටම | පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන - මඩකලපුව | 2017.08.10/11/12/13/14 |
| දෙවන මට්ටම | පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන - වව්නියාව | 2017.09.07/08/09/10/11 |
| දෙවන මට්ටම | 2016 උසස් පෙළ විභාගය සඳහා පෙනී සිටි සිසුන් හට වෘත්තීය සුරක්ෂිතතාවය පිළිබඳ එක් අවුරුද්දක පාඨමාලාව (INSEE ආයතනය හා වෘත්තීය | 2017.10.11 |

| | | |
|---|---|---|
| | සුරක්ෂිතතා සෞඛ්‍ය ආයතනයේ ප්‍රධානත්වයෙන්) | |
| දෙවන මට්ටම | අවිස්සාවේල්ල වෛද්‍ය කඳවුර | 2017.11.28 |
| දෙවන මට්ටම | කොග්ගල වෛද්‍ය කඳවුර | 2017.12.06 |
| දෙවන මට්ටම | කටුනායක වෛද්‍ය කඳවුර | 2017.12.15 |

## 2017 වර්ෂය තුළ NIOSH ආයතනය මගින් පවත්වන ලද පුහුණු පාඨමාලා, වැඩමුළු




ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය පුහුණු කටයුතු විධිමත් ආකාරයෙන් සිදුකරගෙන යන අතර එය කාර්යක්ෂමකර තිබේ. අධ්‍යාපන පොදුසහතික පත්‍ර සාමාන්‍ය පෙළ සුදුසුකම් ලබා ඇති ඕනෑම ශිෂ්‍යයෙකු හට අපගේ සහතික පත්‍ර පාඨමාලාව හැදෑරීමට අවකාශය ඇත. එමෙන්ම වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය පිළිබඳ වෘත්තිකයෙකු වීමට අවකාශය ඇත. අධ්‍යාපන පොදු සහතිකපත්‍ර

උසස් පෙළ සුදුසුකම් ලබා ඇති සිසුන්හට ද අපගේ පාඨමාලා හැදෑරීම අවකාශය ඇති අතර ඒ පිළිබඳ විස්තර ඉහත දක්වා ඇති රූප සටහනෙහි විස්තර දක්වා ඇත.

## *පළමු මට්ටමේ පුහුණුව*

**වෘත්තීය ආරක්ෂාව හා සෞඛ්‍ය පිළිබඳ ජාතික ඩිප්ලෝමා පාඨමාලාව**


වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව කාර්මාන්ත අවශ්‍යතා හා එම අවශ්‍යතා තක්සේරු කිරීමෙන් පසු සකස් කර ඇත. ඒ අනුව මෙම පාඨමාලාව මොඩියුල තුනකින් සමන්විතය. එනම් වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය කළමනාකරණය මොඩියුලය, වෘත්තීය ආරක්ෂණ මොඩියුලය සහ වෘත්තීය සෞඛ්‍ය මොඩියුලය ත්වීත්වයෙන් යුක්ත වේ. එක් මොඩියුලයක් අවසානයේ මොඩියුල විභාගයක් පැවැත්වේ. මෙම විභාගයෙන් පසුව තමා ලබාගත් දැනුම හා කාර්මික අත්දැකීම් මත ව්‍යාපෘති වාර්තාවක් අවසන් විභාගයට පෙර ලබාදිය යුතුය. මෙම පාඨමාලාව න්‍යායාත්මක මෙන්ම ප්‍රායෝගික පුහුණුවකින් යුක්තය. මෙම වසරේ දී ක්ෂේත්‍ර චාරිකාවන් Loard Star පෞද්ගලික ආයතනය, Ceylon Dock Yard පෞද්ගලික ආයතනය, යුනිලීවර් පෞද්ගලික ආයතනය සහ INCEE Cement යන ආයතනයන් ක්ෂේත්‍රචාරිකාව සඳහා යොදාගන්නා ලදී.

2017 වසරේ දී අප ආයතනය විසින් වෘත්තීය ආරක්ෂාව හා සෞඛ්‍ය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලා තුනක් ද පවත්වන ලදි. කණ්ඩායම් 13, 14, සහ 15 යන පාඨමාලා කණ්ඩායම් සඳහා සිසුන් සම්මුඛ පරීක්ෂණයක් තුලින් තෝරාගන්නා ලදී. පෙබරවාරි, මාර්තු යන මාසයන්හි පාඨමාලා කණ්ඩායම් තුනක් ආරම්භ කළ අතර නොවැම්බර් මාසය අවසානයේ මෙම පාඨමලා සම්පූර්ණයෙන් අවසන් වූ අතර එම කණ්ඩායම් අතරින් 42, 47 සහ 44 වශයෙන් වෘත්තීය සුරක්ෂිතතා නිලධාරීන් ලෙස අපගේ පුහුණුව ලබාගන්නා ලදී.


2017 වර්ෂයේ ඔක්තෝම්බර් 12 වැනිදා කොළඹ කිංස්බරි හෝටලයේ ප්‍රධාන ශාලාවේ දී ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය විසින් සංවිධානය කරල ලද ඩිප්ලෝමා ප්‍රධානෝත්සවය සාර්ථකව අවසන් කරන ලදී.

**විෂය මාලාව අනුව පුහුණු මොඩියුල පහත දැක්වේ.**

**ඩිප්ලෝමා පාඨමාලාව (NVQ 05)**





**උසස් ඩිප්ලෝමා පාඨමාලාව (NVQ 06)**




අප ආයතනයෙන් පුහුණුව ලැබූ පිරිස් බොහෝමයක් විදේශරටවල්වල සේවය කරනු ලබයි. ඔවුනට ඉතා ඉහල ඉල්ලුමක් හා ප්‍රතිලාභ ලැබේ. එමෙන්ම අමතර සුදුසුකමක් ලෙස ද සලකනු ලැබේ. ඔවුනට අමතර ප්‍රතිලාභ ලැබීමට මෙය බෙහෙවින් උපකාරී වන පාඨමාලාවකි.

වැඩි දෙනාගේ ඉල්ලීම අනුව NIOSH පාඨමාලාවේ ගුණාත්මක භාවය ඉහළ නැංවීම සඳහා වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කර ඇති අතර පැවති මොඩියුල පදනම් කරගත් පුහුණු ඩිප්ලෝමා පාඨමාලාව පදනම් කරගනිමින් උසස් ගුණාත්මක බවින් යුක්ත උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලාව 2018/2019 වර්ෂය තුළ පැවැත්වීමට නියමිතය.

**වෘත්තීය ආරක්ෂාව හා සෞඛ්‍ය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව (NVQ L05)**




## දෙවන මට්ටමේ පුහුණුව

**වෘත්තීය සුරක්ෂිතතාව සහ සෞඛ්‍ය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව**

2017 වර්ෂයේ දී වෘත්තීය සුරක්ෂිතතාව සහ සෞඛ්‍ය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාවන් පහක් ඉතා සාර්ථක ලෙස පවත්වන්නට යෙදුනි. එක් එක් පාඨමාලාවේ කාලය සති 15ක් වන අතර සිසුන් 140 දෙනෙකුට වැඩි පිරිසක් සහභාගී විය. මෙම පාඨමාලා සියල්ල විශේෂ වූ අතර පාඨමාලා අංක 20, 21, 22, 23, 24, සහ 25 කණ්ඩායම් ඉතා සාර්ථක ලෙස මෙම පාඨමලාව අවසරන් කළේය. එමෙන්ම මෙම

පුහුණුව අවසන් කර 2017 ඔක්තෝම්බර් 12වන දින සහතික පත්‍ර ප්‍රධානෝත්සවය පවත්වන ලදී. මෙම පුහුණුව ලැබුවන් සියලු දෙනා පුහුණුව ලැබූ ආයතන අධීක්ෂණය කරන ලද අතර, ඔවුන්ගේ සේවා ස්ථානවල අනතුරු අවම කර ගැනීමට පිටුවහලක් වී ඇත. මේවන වන විට වැඩි ප්‍රමාණයක් සුරක්ෂිතතා නිලධාරින් ලෙස දැනට සේවයේ යෙදී සිටිති. අධ්‍යාපන පොදු සහතික පත්‍ර උසස් පෙළ සුදුසුකම් ඇති, වෘත්තීය ආරක්ෂාව හා සෞඛ්‍ය පිළිබඳ උනන්දුවක් දක්වන ඕනෑම අයෙකුට මෙම පාඨමාලාව හැදෑරිය හැක. විශේෂිත වූ වෘත්තීය සුරක්ෂිතතා සහ සෞඛ්‍යය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාවක් INCCI සිමෙන්ති පෞද්ගලික ආයතනයේ විශේෂිත වූ ඉල්ලීම පරිදි 12දෙනෙකුගෙන් යුක්ත සිසුන් පිරිසකට පාඨමාලා ආරම්භය සිදුකරන ලදී.



සතියේ දින සහතික පත්‍ර පාඨමාලාව (16වන කණ්ඩායම) 2017.01.13



සති අන්ත පාඨමාලාව ( 19 වන කණ්ඩායම) 2017. 08. 20

**ඉදිකිරීම් ක්ෂේත්‍රයේ සුපරීක්ෂකවරුන් සඳහා දින තුනක පුහුණුව.**

මෙම වැඩමුළුව ඉදිකිරීම් කර්මාන්තයේ සුපරීක්ෂකවරුන් සඳහා විශේෂයෙන් අවධානය යොමුකර සකසන ලද පුහුණුවකි. මෙම පුහුණු පාඨමාලාව දින දෙකක් පැවති අතර 35 දෙනෙකු සහභාගි විය. සාප්පු සංකීර්ණ සේවකයින්ගේ හොඳම කාර්ය සාධනය හා වෘත්තීය සෞඛ්‍ය සුරක්ෂිතතාව නගා සිටුවීමේ අරමුණින් මෙම පුහුණුව පවත්වන ලදී. වෘත්තීය සුරක්ෂිතතාව සහ සෞඛ්‍ය පිළිබඳව මනා පුහුණුවක් ලබමින් ඔවුන්ගේ මෘදු කුසලතා වර්ධනය කර ගැනීමට ද මෙම පුහුණුව හේතු විය. 2017 ජනවාරි 11, 12 යන දෙදිනයන් තුළ ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනයේ ශ්‍රවණාගාරයේ පවත්වන ලදී.

**පාරිසරික ආරක්ෂාව සහ අපද්‍රව්‍ය කළමනාකරණ පුහුණුව**

2017 ජනවාරි මස 20වන දින කර්මාන්තයන්ගේ ඉල්ලීම මත ශ්‍රී ලංකාවේ පාරිසරික රැකවරණය හා සම්බන්ධ නීති සම්පාදනය සහ ශ්‍රී ලංකාවේ දැනට පවත්නා ප්‍රායෝගීක අපද්‍රව්‍ය බැහැර කිරීමේ ක්‍රමවේදය මත පුහුණුවක් ලබාදීම මෙම පාඨමාලාවේ මූලික අරමුණ වේ. ඒ අනුව, අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරියේ සහ පාරිසරික අධිකාරියේ සම්පත් දායකයින්ට පුහුණු සැසි පැවැත්වීම සඳහා ආරාධනා කරනු ලැබීය. NIOSH ආයතනය ප්‍රධාන පුහුණු සංවිධායක ලෙස, වෘත්තීය ආරක්ෂාව හා සෞඛ්‍ය පිළිබඳ විශේෂ දේශන ලබාදුන් අතර විවිධ වර්ගයේ අපද්‍රව්‍ය හසුරුවන පුද්ගලික ආරක්ෂක උපකරණ භාවිතය පිළිබඳ ප්‍රායෝගික පුහුණු සැසි කිහිපයක් පවත්වනු ලැබීය.

**බොයිලේරු ක්‍රියාකරවන්නන් පුහුණු කිරීම.**

2017.02.09 දින 16 දෙනෙකුගේ සහභාගිත්වයෙන් කර්මාන්ත ශාලාවල ඉල්ලීම අනුව එක් දින පාඨමාලාවක් පවත්වන ලදී. මෙම පුහුණුව අවසන් කල සියලු දෙනාහට සහතික පත්‍ර ලබාදීම සිදුකරන ලදී.

**කර්මාන්ත ක්ෂේත්‍රයේ හෙදියන් සඳහා වූ පුහුණුව**

ජාතික වෘත්තීය සුරක්ෂිතතා සහ සෞඛ්‍ය ආයතනය විසින් 2017 පෙබරවාරි 28වන දින කර්මාන්ත ශාලා, හෝටල් ක්ෂේත්‍රය, ඇගලුම් නිශ්පාදන ක්ෂේත්‍රයේ සේවය කරන කාර්මික හෙදියන් සඳහා එක් දින පුහුණුවක් ආරම්භ කරන ලදී. මෙම පුහුණුව මගින් ආවරණය කරනු ලබන විෂය ක්ෂේත්‍රය වනුයේ අනතුරක් වීමට පෙර අවධානම් හඳුනා ගැනීම, සාකච්ඡාමය කුසලතා වර්ධනය කිරීම, හදිසි අනතුරක් දැනුම් දෙන ආකාරය පිළිබඳ දැනුවත්කිරීම හා එය වාර්තාකර දත්ත පදනම හැසිරවීම පිළිබඳ ප්‍රායෝගීක කරුණු පිළිබඳව පුලුල් පුහුණුවක් ලබාදෙනු ලැබේ. මෙහි ඉගැන්වීම විශේෂයෙන් නිර්මාණය කර

ඇත්තේ, දත්ත හා තොරතුරු මත පදනම්ව වෘත්තීය සුරක්ෂිතතාව සහ සෞඛ්‍ය පිළිබඳ තීරණ ගැනීමය. මෙම පුහුණු පාඨමාලාව සඳහා 18 දෙනෙකු සහභාගි විය.

**ඇගලුම් ක්ෂේත්‍රයේ නියුතු සේවකයින් සඳහා වෘත්තීය සුරක්ෂිතාව සහ සෞඛ්‍ය පුහුණු පාඨමාලාව**

2017 පෙබරවාරි මස 28 දින ඇගලුම් අංශයේ අධීක්ෂණ ශ්‍රේණියේ සේවකයින් සඳහා එක් දින වැඩමුළුවක් ලෙස මෙම පුහුණුව පැවති අතර ඒ සඳහා 25 දෙනෙකු සහභාගි විය.

**උස් ස්ථානයන්හි වැඩකිරීම පිළිබඳ වෘත්තීය සුරක්ෂිතාව සහ සෞඛ්‍ය පුහුණු පාඨමාලාව**

2017 අප්‍රේල් 28 වන දින ඉදිකිරීම් ස්ථාන හා ඉදිකර ඇති ස්ථානවල වැඩකරන සේවකයින් සඳහා විශේෂයෙන් සකස් කර තිබුණි. BMICH හි දි පැවැති අතර ඒ සඳහා 85 දෙනෙකුගේ සහභාගිත්වය සිදුවූ අතර ප්‍රායෝගික සැසියක් ලෙස සේවකයින්ට අත්දැකීම් ලබාදීම සිදුකරන ලදී.


**සංවෘත්ත අවකාශ පිළිබඳ වෘත්තීය සුරක්ෂිතතාව සහ සෞඛ්‍ය පුහුණු පාඨමාලාව**

2017 මැයි 16වන දින පැවැති මෙම විශේෂිත පාඨමාලාව සඳහා සේවකයින් 10 දෙනෙකුගේ සහභාගිත්වය සිදු විය.

**සුපරීක්ෂකනරුන්/තත්ත්ව පරීක්ෂකවරුන් සඳහා වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය පිළිබඳ එක්දින වැඩමුළුව**

මෙම වැඩමුළුව ඉදිකිරීම් කර්මාන්තයේ සුපරීක්ෂකවරුන් සඳහා විශේෂයෙන් අවධානය යොමුකර සකසන ලද පුහුණුවකි. සාප්පු සංකීර්ණ සේවකයින්ගේ හොදම කාර්ය සාධනය හා වෘත්තීය සෞඛ්‍ය සුරක්ෂිතතාව නගා සිටුවීමේ අරමුණින් මෙම පුහුණුව දින තුනක් ඇතුළත නිමකරන ලදී. මොවුන් මෙම පුහුණුව මගින් ලබාගත් අවධානම් තක්සේරු පිළිබඳ අත්දැකීම් ලබාගත් අතර පුද්ගලික ආරක්ෂණ උපකරණ නිසිලෙස භාවිත කිරීම පිළිබඳව පුහුණුවීම් කරනු ලැබීය.





**ප්‍රථමාධාර භාවිතය පිළිබඳ පුහුණු පාඨමාලාව**

2017 වර්ෂයේ ජූලි මාසයේ 02, 03 සහ 04 දිනයන්හි ප්‍රයෝගික පුහුණුව ලබාදෙමින් මෙම පුහුණු පාඨමාලාව විවිධ කර්මාන්තයන්හි ඉල්ලීම පරිදි 09 දෙනෙකු සඳහා අප ආයතනය විසින් පුහුණුව ලබාදෙන ලදී.

**තුන් දින ඉදිකිරීම් ආරක්ෂක පුහුණුව**

2017 ජූලි මස 05, 06, 07 යන තෙදිනයන්හි 09 දෙනෙකුගෙන් යුක්ත කණ්ඩායමක් සඳහා තුන් දින ඉදිකිරීම් ආරක්ෂක පුහුණු වැඩසටහන පැවැත්වීම සිදුකළ අතර, එය ඉදිකිරීම් ක්ෂේත්‍රයේ සුපරීක්ෂකවරුන් සඳහා විශේෂිත පුහුණු වැඩසටහනක් විය.

**විදුලි ආරක්ෂක පුහුණු වැඩසටහන.**

2017 ජූලි මස 06, 07යන දෙදිනයන්හි අප ආයතනය විසින් විදුලි ආරක්ෂක පුහුණු වැඩසටහනක් පැවැත්විණි. මෙහිදි විදුලි වැඩ සිදුකරන ආකාරය පිළිබඳ විදුලි කාර්මිකයන්ගේ කුසලතා වර්ධනය කිරීම සිදුකරන ලදී. මේ සඳහා 22 දෙදෙනෙකුගේ සහභාගිත්වය විවිධ කර්මාන්තශාලාවන්ගෙන් සිදු විය.




**රසායනික ආරක්ෂාව පිළිබඳ එක් දින පුහුණුව**

2017 ජූලි මාසයේ 18වන දින 13 දෙනෙකුගේ සහභාගිත්වයෙන් මෙම පුහුණු වැඩසටහන පැවැත්විනි.

**OSHA 18001 පුහුණුව**

2017 ජූලි 18 වෙනි දින පැවැති මෙම වැඩසටහන සඳහා 14 දෙනෙකුගේ සහභාගිත්වය සිදුවිය.

**ජාතික සම්මන්ත්‍රණය සහ දැනුවත් කිරීමේ වැඩසටහන**

**සුරක්ෂිතතා සතිය - ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛය ප්‍රවර්ධන වැඩසටහන**

වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය ආයතනය 2009 අංක 38 දරණ පනත මගින් ව්‍යවස්ථාපිත ආයතනයක් ලෙස එහි අරමුණු වලින් එකක් ලෙස වෘත්තීය ආරක්ෂාව හා සෞඛ්‍ය පිළිබද ජාතික ව්‍යාපාරය සංවිධානය කරන ලදී. ඒ අනුව NIOSH විසින් විවිධ ප්‍රවර්ධන ක්‍රියාකාරකම් සාමාන්‍ය ජනතාවගේ හා වැඩකරන ශ්‍රම බලකායේ ආරක්ෂාව උදෙසා විවිධාකාරී වූ වැඩසටහන් සංවිධානය කරන ලදී.

**සුරක්ෂිතතාව හා සෞඛ්‍ය පිළිබද පාසැල් දරුවන් දැනුවත් කිරීමේ වැඩසටහන ආරම්භ කිරීම.**

2017 ඔක්තෝම්බර් 09 වන දින ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය විසින් පාසල් සිසුන්ගේ ආරක්ෂාව හා සෞඛ්‍ය පිළිබද දැනුවත් කිරීමේ ප්‍රවර්ධන වැඩසටහනක් ලෙස පාදුක්ක සිරි පියරතන විදුහල කේන්ද්‍රකරගෙන සිදුකරන ලදී. මෙහිදී ගිනි ආරක්ෂාව පිළිබද වැඩමුළුවක් හා ඒ සම්බන්ධව ප්‍රායෝගීක පුහුණුවක් ලබාදෙනු ලැබීය. පාසල් සිසුන්ගේ දැඩි උනන්දුව මේ සඳහා යොමු වූ අතර ගුරුවරුන්ට හා පැමිණි සිටි සියලු දෙනාට මෙය නවමු වූ අත්දැකීමක් විය.









## ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය සමුළුව 2017

ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය සතිය  සෑම අවුරුද්දකම ඔක්තෝම්බර් දෙවන සතිය අමාත්‍ය මණ්ඩල කැබිනට් මණ්ඩලය විසින් ප්‍රකාශයට පත්කර ඇත. මෙම සම්මන්ත්‍රණය වාර්ෂිකව පවත්වනු ලබන අතර ඒ සඳහා ශ්‍රී ලංකීක සේවා සේවක දෙපාර්ශවයම නියෝජනය කරමින් කර්මාන්ත හිමියන්, සුරක්ෂිතතා නිලධාරින් සහභාගි විය.

ඔක්තෝම්බර් දෙවන සතිය ‘‘ජාතික සුරක්ෂිතතා සතිය’’ ලෙස නම් කරන අතර කම්කරු හා කම්කරු සබදතා අමාත්‍යාංශය, ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය සහ කාර්මික ක්ෂේත්‍රය නියෝජනය කරන සියලු දෙනා මෙම සතිය සැමරීම සිදුකරන අතර, එහි අරමුණ වන්නේ වෘත්තීය


සුරක්ෂිතතාව ප්‍රවර්ධනය කිරීමත් එහි ඇති වැදගත්ක්‍රම පිළිබඳව සියලුදෙනාම දැනුවත් කිරීමත් කර්මාන්ත ප්‍රජාව අතර වෘත්තීය දැනුම හුවමාරු කර ගැනීමත්ය.

**ජාතික වෘත්තීය සෞඛ්‍ය සුරක්ෂිතතා සතිය සැමරීම හා ඒ සඳහා සූදානම් වීම**

**තේමාව.- වෘත්තීමය වශයෙන් සිදුවන තුවාල හා රෝග වැළැක්වීම සහ ආරක්ෂිතව නිවෙස්බලා පිටත්වයෑම.**

**වෘත්තීය සුරක්ෂිතතා සතිය පිළිබඳව දැනුවත් කිරීම සඳහා සකසන ලද විද්‍යුත් සැකැස්ම සහ විශේෂ සැකැස්ම**






**ජාතික වෘත්තීය සුරක්ෂිතතා සතිය ආරම්භයට පෙර පැවති පුවත්පත් සාකච්ඡාව**


වෘත්තීය සුරක්ෂිතතාව සහ සෞඛ්‍ය පිළිබඳ විශේෂ පණිවුඩය ගරු අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් සංවිධානය කරන ලදී. රටේ ආරක්ෂාව හා සෞඛ්‍ය පිළිබඳව, කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය ගරු ඩබ්ලිව්. ඩී. ජේ සෙනෙවිරත්න අමාත්‍යතුමා සිය කැපවීම සහ අමාත්‍යාංශයේ කැපවීම සහතික කර තිබේ.




**ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය සමුළුව 2017**

2017 ඔක්තතෝම්බර් 11වන දින කොළඹ කිංස්බරි හෝටලයේ දී පවත්වන ලදී. වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබද ජාතික සම්මන්ත්‍රණය අප ආයතනය විසින් සංවිධානය කරනු ලබන අතර එහි මූලික පරමාර්ථය වනුයේ වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය පිළිබදව මානව සම්පත් කළමනාකරුවන් හා කර්මාන්තයන්හි ඉහළ කළමනාකාරිත්වයේ සිටින පිරිස දැනුවත් කිරීමය. මෙම වර්ෂයේ සුවිශේෂීයත්වය වූයේ මෙම සමුළුව සදහා ඉතා විශාල සුරක්ෂිතතා නිලධාරින් පිරිසක් සහභාගි වීමය.

මෙම වසරේ පැවති සමුළුව ඉතා සුවිශේෂී එකක් වූයේ සිංගප්පූරුවේ සිට විශේෂ දේශකයෙකු ලෙස දීපක් කාෂ්යාප් මහතා වෘත්තීය සුරක්ෂිතතා සමුළුව සදහා පැමිණි සුරක්ෂිතතා නිලධාරින් සදහා වෘත්තීය සුරක්ෂිතතාව හා ආරක්ෂාව පිළිබද සිංගප්පූරු අත්දැකීම් පිළිබද විශේෂිත දේශනයක් සිදුකරන ලදී. ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය නිරන්තරයෙන් උත්සහා කරනු ලබන්නේ සුරක්ෂිතතාව හා සෞඛ්‍ය ක්ෂේත්‍රයේහි තිබෙන සෞඛ්‍ය ගැටලු වළක්වාගැනීම සදහා නව ක්‍රමඋපායන් සෙවීමට හා හදුන්වාදීමටය. එමෙන්ම සුරක්ෂිතතාව හා සෞඛ්‍ය පිළිබද නව සංකල්ප හදුන්වා දෙමින්, අප රටෙහි කාර්මික ප්‍රජාව අතර සුරක්ෂිතතාව හා සෞඛ්‍ය දැනුම හුවමාරු කරගැනීමට දෙස් විදේශ් කථිකයින්ගේ සහභාගිත්වය මෙම සමුළුවේ සුවිශේෂීයත්වයක් විය. සහභාගි වූ සුරක්ෂිතතා නිලධාරින් මෙරටට අමතරව විදේශයන්හි සිට පැමිණි විදේශකියන් සමග ඔවුන්ගේ දැනුම හුවමාරු කරගනු ලැබීය.








**ඩිප්ලෝමා සහතික පත් ප්‍රධානෝත්සවය**

ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව ඉතා සාර්ථික ලෙස නිමකරන ලද විධායක ශ්‍රේණියේ රැකියාවල නියුතු නිලධාරින් සඳහා ඩිප්ලෝමාධාරින් ලෙස සහතිකපත් ලබාදීමේ ඩිප්ලෝමා ප්‍රධනෝත්සවය මෙම වසරේ දී ද කොළඹ කිංස්බරි හෝටයේ ප්‍රධාන ශාලාවේ දී පවත්වන ලදී. ඩිප්ලෝමාධාරින් 150කට වැඩි පිරිසක් මේ සඳහා සහභාගි විය. 2017 ඔක්තතෝම්බර් 11වන දින පැවති මෙම උත්සවය සඳහා රාජ්‍ය අමාත්‍ය ගරු රවීන්ද්‍ර සමරවීර මහතාද කම්කරු හා වෘත්තීය සමිති සබඳතා සබරගමු සංවර්ධන අමාත්‍යාංශය නියෝජනය කරමින් සහභාගි විය.බොහෝමයක් ආරාධිත අමුත්තන් පිරිසක් මේ සඳහා පැවති රාත්‍රී භෝජන සංග්‍රය සඳහා සහභාගි විය.



**NIOSH විසින් පවත්වනු ලැබූ පෝස්ටර් ව්‍යාපාරය**








**කර්මාන්ත සඳහා වෘත්තීය සෞඛ්‍ය හා ආරක්ෂාව පිළිබඳ කර්මාන්තයන් සඳහා උපදේශන සේවාව.**

වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය කලමණාකරණ පද්ධති සංවර්ධන සඳහා උපදේශන සේවා සැපයීම ද අප ආයතනය විසින් සිදුකරනු ලබයි. මෙම සේවාව සපයනු ලබන්නේ ආයතනයන්හි ඉල්ලීම්වලට අනුකූලවය.

**උපකරණ නිවැරදි භාවිතය පිළිබඳව උපදේශන සේවාව සැපයීම.**

රැකියා පිරිවිතරයන්ට අනුව පුද්ගල ආරක්ෂණ උපකරණ නිසි භාවිතය පෙන්නුම් කිරීමට අවශ්‍ය මිනිස් ආකෘතින් සංවර්ධනය සහ මෙම පෞද්ගලික ආරක්ෂක උපකරණ නිසි භාවිතය පිළිබඳ සේවකයින් සඳහා පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම ද අප ආයතනය විසින් සිදුකරනු ලබයි.



**වැඩ කිරීමට යෝග්‍යතාව - නොමිලේ වෛද්‍ය කඳවුරු පැවැත්වීම**

2017 වර්ෂය අවසන් වීමට ප්‍රථම අවිස්සාවේල්ල, කෝග්ගල, කටුනායක, මීරිජ්ජවිල සහ කුණ්ඩසාලේ යන ප්‍රදේශයන්හි වෛද්‍ය කඳවුරක් පවත්වන ලෙස ශ්‍රම වාසනා අරමුදල 2017.11.10 දිනැති ලිපිය මගින් අපව දැනුවත්කර තිබුණි. ශ්‍රම වාසනා අරමුදලෙහි සමානාධිකාරීතුමා විසින් 2017.11.22 දින අත්සන් කරන ලද අතර එයට අප ආයතනයේ අධ්‍යක්ෂක මණ්ඩලය විසින් අවසර ලබාදෙන ලදී.

අධ්‍යක්ෂක ජනරාල් වෛද්‍ය චම්පිකා අමරසිංහ මැතිනියගේ ඉල්ලීම මත 2017 නොවැම්බර් 24 දින අධ්‍යක්ෂක මණ්ඩල අවසරය ඇතිව NIOSH විසින් සිය සේවාවන් ව්‍යාප්ත කිරීම සිදුකරන ලදී.

NIOSH ශ්‍රී ලංකාවේ ආයෝජන මණ්ඩලයේ සියලුම කලාප ආවරණය වන පරිදි සේවා සැපයීම සිදුකර ඇති අතර පහත සේවාවන් එම කලාපයන්හි සේවකයින් සඳහා ලබා දී ඇත.

| ආයෝජන කලාපයේ නම | සේවාව ලබාදුන් දිනය | ලබාදුන් සේවාවන් |
|---|---|---|
| අවිස්සාවේල්ල කලාපය | 2017.11.24 | වැඩ කිරීමට යෝග්‍යතාව - බෝ නොවන රෝග පරීක්ෂණය - වෛද්‍ය කණ්ඩායම් දෙකක් හා හෙදියන් 06 දෙනෙකු සහභාගි විය.<br><br>පෙනහළු පරීක්ෂණ<br><br>කන් පරීක්ෂණ<br><br>ශාරීරික පරීක්ෂණ සහ සමේ රෝග පරීක්ෂා කිරීම<br><br>රුධිර පරීක්ෂණ Hb, FBS, SGOT, SGPT<br><br>BMI ගණනය කිරීම සහ අවවාද ලබාදීම<br><br>දන්ත පරීක්ෂාව හා දත් පිරවීම |
| කොග්ගල වෙළඳ කලාපය | 2017.12.06 | වැඩ කිරීමට යෝග්‍යතාව - බෝ නොවන රෝග පරීක්ෂණය - වෛද්‍ය කණ්ඩායම් දෙකයි හෙදියන් 06 සහභාගි විය.<br><br>පෙනහළු පරීක්ෂණ |

| | | |
|---|---|---|
| | | කන් පරීක්ෂණ<br><br>ශාරීරික පරීක්ෂණ සහ සමේ රෝග පරීක්ෂා කිරීම<br><br>රුධිර පරීක්ෂණ Hb, FBS, SGOT, SGPT<br><br>BMI ගණනය කිරීම සහ අවවාද ලබාදීම<br><br>දන්ත පරීක්ෂාව හා දත් පිරවීම |
| කටුනායක වෙළඳ කලාපය | 2017.11.27 | වැඩ කිරීමට යෝග්‍යතාව - බෝ නොවන රෝග පරීක්ෂණය - වෛද්‍ය කණ්ඩායම් දෙකක් හා හෙදියන් 06 දෙනෙකු සහභාගි විය.<br><br>පෙනහළු පරීක්ෂණ<br><br>කන් පරීක්ෂණ<br><br>ශාරීරික පරීක්ෂණ සහ සමේ රෝග පරීක්ෂා කිරීම<br><br>රුධිර පරීක්ෂණ Hb, FBS, SGOT, SGPT<br><br>BMI ගණනය කිරීම සහ අවවාද ලබාදීම<br><br>දන්ත පරීක්ෂාව හා දත් පිරවීම |
| මිරිජ්ජවිල | | වසර අවසානයේ ආයෝජන මණ්ඩලයට ඉලක්ක තිබේන බැවින් ඒවා අවසන් කල යුතු බැවින් වෛද්‍යකදවුරු වලින් ලබාදෙන සේවාව ලබාගැනීමට ඔවුන් සුදානම් නැත. |
| කුණ්ඩසාලේ | | වසර අවසානයේ ආයෝජන මණ්ඩලයට ඉලක්ක තිබේන බැවින් ඒවා අවසන් කල යුතු බැවින් වෛද්‍යකදවුරු වලින් ලබාදෙන සේවාව ලබාගැනීමට ඔවුන් සුදානම් නැත. |

සේවා සැපයීමේ දී විශේෂ සැලකිල්ල.

1. ශ්‍රම වාසනා අරමුදලහේ සමානාධිකාරි මහතා විසින් සිදුකරන ලද ලිඛිත ඉල්ලීමකට අනුකූලව NIOSH විසින් මෙම සේවා ප්‍රතිපාදන ක්‍රියාත්මක කරන ලදී.

2. ආයෝජන මණ්ඩලයේ සේවකයින් සඳහා වෛද්‍ය සේවා සැපයීමට හා අනෙකුත් සනීපාරක්ෂක පහසුකම් සැපයීමට අධ්‍යක්ෂක මණ්ඩලයේ අනුමැතිය ලබාදෙන ලදී.

3. කර්මාන්තයන්ට සහ සේවකයින්ට වෛද්‍ය සේවා සැපයීමට NIOSH ආයතනයට අවශ්‍ය වූ විට, දන්ත වෛද්‍ය සේවා සැපයීම, බෝ නොවන රෝග පරීක්ෂණ, සමේ පරීක්ෂණ, BMI අගය පවත්වාගෙන යැමට අවශ්‍ය උපදේශන සේවා රැසක් ඉතා සවිස්තරාත්මකව සැපයීම සිදුකරන ලදී.

4. උදේ තේ වේලාව සහ දහවල් ආහාර ලබාගන්නා වේලාවන්හි දී නොසිතූ ලෙස සේවකයින් බොහෝ පිරිසක් වෛද්‍ය කඳවුර සඳහා සහභාගී වූ අතර එය සමූහ කළමනාකරණය සඳහා අපහසුවිය. එම වේලෙහි සහභාගී වූ පිරිස වැඩි වූ හෙයින් ඔවුන් පිළිබඳව සවිස්තරාත්මක වාර්තා තබාගැනීම අපහසු විය.

5. NIOSH ආයතනය විසින් සේවකයින් කිහිපදෙනෙකුගේ කන් පරීක්ෂා කිරීම සිදුකළ අතර ඔවුන් සඳහා වෙන වෙනම ආවධානය යොමුකරන ලදී. එමෙන්ම ලියාපදිංචිය සිදුනොකර පෙනහළු ක්‍රියාකාරිත්වය පරීක්ෂාවට ලක්කරන ලදී.

6. මෙම වැඩසටහන NIOSH ක්‍රියාකාරි සැලැස්ම තුළ ඇතුළත් නොවුව ද ශ්‍රම වාසනා අරමුදලෙහි කළමනාකාර අධ්‍යක්ෂකවරුන්ගේ හා ලේකම්තුමාගේ ඉල්ලීම පරිදි සිදුකරන ලදී.

7. NIOSH විසින් සිදුකළ මෙම කාර්යය ඉතා අමාරු කාර්යයක් විය. මෙම සියලු කාර්යයන් සිදුකළේ සතියක් දෙකක් ඇතුළතය. (නිදහස් වෙළඳ කලාපයන් සමග සම්බන්ධීකරණය කිරීම, දන්ත වෛද්‍ය සේවාව සම්බන්ධීකරණය කිරීම, බෝ නොවන රෝග පිළිබඳව දැනුවත් කිරීම, පෝෂණය පිළිබඳ දැනුම ලබාගැනීම ආදි වශයෙන් දැනුවත් කිරීම් බොහෝමයක් සිදුකරන ලදී.)

8. NIOSH විසින් වෙළඳ කලාප තුනක් ආවරණය කළ අතර එහිදි වෛද්‍ය කඳවුර සංවිධානය කිරීම, සම්බන්ධීකරණය කිරීම, සකස්කිරීම යන සියලු කාර්යයන් වෙළඳ කලාපයන්හි කිසිදු මුදල් අයකිරීමකින් තොරව සිදු විය.

9. NIOSH විසින් ප්‍රවාහන වියදම්, ආහාර, ජායාපිටපත් ආදිය ලබාදීමට එකග වී නොසිටියද එම වියදම් දැරීමට අප ආයතනයට සිදු විය.

වැඩ කිරීමේ යෝග්‍යතාව අවසන් ප්‍රතිඵල පහත පරිදි වේ.

2017 නොවැම්බර් මස 24වන දින අවිස්සාවේල්ල ආයෝජන ප්‍රවර්ධන කලාපයේ ප්‍රධාන ශ්‍රවණාගාරයේ වෛද්‍යකඳවුර පවත්වන ලදී.

NIOSH කණ්ඩායම 2017 නොවැම්බර් 16වන දින ආයෝජන ප්‍රවර්ධන කලාපයේ සංචාරය කල අතර එහිදි කලාප කළමනාකාරතුමා, මානව සම්පත් කළමණාකරුවන් 31 දෙනෙකු සමග වෛද්‍යකඳවුර පිළිබඳව සාකච්ඡා කළේය. NIOSH ආයතනය විසින් නොවැම්බර් 26වන දින වෛද්‍ය කඳවුර පැවැත්වීමට තීරණය කළ නමුත්, අමාත්‍යාංශයේ හා ශ්‍රම වාසනා පදනමේ ඉහල කළමනාකාරිත්වයේ ඉල්ලීම පරිදි නොවැම්බර් 30 දින වෛද්‍යකඳවුර පැවැත්වීම සිදුවිය. මෙහිදි NIOSH විසින් විවිධ පරීක්ෂණ පැවැත්වූ අතර එම පරීක්ෂණයන්ට සේවකයින් සහභාගී වූ අතර ඔවුන්ට විවිධ පරීක්ෂණ සිදුකරගැනීමටත් වෛද්‍යවරුන්ගේ අවවාද ලබාගැනීමටත් හැකි විය.

NIOSH කණ්ඩායම පෙ.ව 7.30ට අවිස්සාවේල්ල වෙළඳ කලාපයට පැමිණි අතර පෙ.ව 8.30 වන විට වෛද්‍ය පරීක්ෂණ සිදුකිරීම ආරම්භ කරන ලදී.








පහත සඳහන් ආයතනයන් NIOSH විසින් පවත්වනු ලැබු වෛද්‍ය කඳවුර සඳහා සහභාගි විය.

| ආයතනයේ නම | සහභාගි වූ ප්‍රමාණය |
|---|---|
| ටීජේ ලංකා ( Teejay Lanka prints Pvt. Ltd) | 16 |
| ටීජේ ලංකා පීඑල්සී (Teejay Lanka Plc) | 80 |
| MIDAS - ප්‍රිමියර් පොලිමර් අංශය (Prime Polimer Division ) | 100 |
| YKK Lanka (Pvt) Ltd | 80 |
| Jay Jay Child wearer Lanka ( Pvt) Ltd. | 20 |
| ලාලන් රබර් පෞද්ගලික ආයතනය | 57 |
| මාස් ක්‍රීඩා (MAS Kreeda) | 75 |

| | |
|---|---|
| Kailash Metachem (Pvt) Ltd. | 48 |
| CBL Exports (Pvt) Ltd | 160 |
| Brandix Avissawella | 20. |
| Avissawella Tea Factory | 68 |
| Concord Apperal (Pvt) Ltd | 47 |
| මාස් ඇක්ටිව් (MAS Active (PVT) Ltd) | 51 |
| බිෂොප් ගැමා (BISHOFF Gamma ) | 10 |
| Lanmic Pvt. Ltd | 5 |
| ලංකා මිනරල් (Lanka Mineral) | 10 |
| Latex Green | 7 |
| Prime Polymers (Pvt.) Ltd | 18 |

අවිස්සාවේල්ල වෛද්‍යකදවුරෙහි ප්‍රගතිය පහත පරිදි දැක්විය හැක.

| පරීක්ෂා කිරීම | පරීක්ෂාවට ලක් වූ ප්‍රමාණය | හදුනාගත් සෞඛ්‍ය ගැටලු | ප්‍රතිශතය |
|---|---|---|---|
| වැඩ කිරීමට යොග්‍යය වීම | 151 | 151 | වැඩ කිරීමට සුදුසුය |
| බෝ නොවන රෝග පරීක්ෂණ | 151 | 34 | 22% |
| දර්ශන පරීක්ෂණ | 100 | 4 | 4% |
| පෙනහළු ක්‍රියාකාරීත්වය බැලීම | 75 | 10 | 13% |
| ශ්‍රවණ පරීක්ෂාව | 61 | 2 | 3% |
| සම පරීක්ෂා කිරීම | 100 | ශුන්‍යය | ශුන්‍යය |
| රුධිර පරීක්ෂණ සිදු කිරීම පහත සදහා Hb, FBS, SGOT, SGPT | 151 | 5 | 3% |
| දන්ත පරීක්ෂණ හා දත් පිරවීම | 100 | 77 | 77% |
| BMI අගය පිළිබද ජනතාව දැනුවත් කිරීම හා අවවාද ලබාදීම | 151 | 68 | 45% |

**කොග්ගල වෙළඳ කලාපයේ වැඩකරන ජනතාව සදහා අවශ්‍ය වෛද්‍ය පහසුකම් ලබාදීම හා එහි ප්‍රතිඵලයන් පහත පරිදි දැක්විය හැක.**

| ආයතනයේ නම | සහභාගි වූ ප්‍රමාණය |
|---|---|
| ACE Appeals Pvt. Ltd | 5 |
| Brandix Apperal Solutions Ltd. | 38 |
| ලංකා ඇගලුම් පෞද්ගලික ආයතනය | 15 |
| Trend settere Pvt. Ltd | 30 |
| කොග්ගල ඇගලුම් කර්මාන්ත ආයතනය (Koggala Garments ( Pvt) Ltd.) | 20 |
| Fair mount Apperels (Pvt) Ltd | 37 |
| Nobel weare Pvt. Ltd. | 25 |
| Polytex Garments (Pvt) Ltd. | 18 |
| Vogue Tex (Pvt) Ltd | 10 |
| Unichella 1& 11 | 20. |
| Alpha Tex Pvt. Ltd. | 17 |
| BAFF Polymech (Pvt) Ltd | 47 |
| G.L.Yatching Asia (PVT) Ltd | 57 |

කොග්ගල ආයෝජන ප්‍රවර්ධන කලාපයේ ප්‍රතිඵල පහත පරිදි දැක්විය හැක

| පරීක්ෂාව | පරීක්ෂා කළ ප්‍රමාණය | හදුනාගත් සෞඛ්‍ය ගැටලු | ප්‍රතිශතය |
|---|---|---|---|
| වැඩ කිරීම සදහා ශාරීරික යෝග්‍යතාවය | 137 | 2 | 1.4%<br>රෝහලට යොමු කිරීම<br>(අද දවස තුළ ඇද වැටීම්, පිටුපසට සිදුවන හානි සහ පපු පෙදසට සිදුවන අසාධන) |
| ඇස් පරීක්ෂාව | 137 | 6 | 4.3% |
| පෙනහළු ක්‍රියාකාරිත්වය | 88 | 18 | 20% |

| | | | |
|---|---|---|---|
| කන් පරීක්ෂාව | 77 | 2 | 2.6% |
| සම පරීක්ෂා කිරීම | 137 | 12 | 8.7% |
| රුධිර පරීක්ෂාව Hb, FBS, SGOT, SGPT | 107 | 10 | 9.3% |
| BMI අගය ගණනය කිරීම හා උපදේශනය | 137 | 15 | 10.9% |

**කටුනායක වෙළද කලාපයේ වැඩකරන ජනතාව සදහා අවශ්‍ය වෛද්‍ය පහසුකම් ලබාදීම හා එහි ප්‍රතිඵලයන් පහත පරිදි දැක්විය හැක.**

| ආයතනයේ නම | සහභාගී වූ ප්‍රමාණය |
|---|---|
| MAIDAS Pvt. Ltd | 18 |
| Teejay Lanka Plc. | 40 |
| Prime Polimer Division | 90 |
| CBL (Pvt) Ltd | 80 |
| Next ( Pvt) Ltd. | 25 |
| Isebella (Pvt) Ltd | 57 |
| UTP Pvt. Ltd | 75 |
| Expo engineering (Pvt) Ltd. | 45 |
| BBSL (Pvt) Ltd | 120 |
| Brandix | 20. |
| KIK Pvt. Ltd | 65 |
| Concord Apperal (Pvt) Ltd | 47 |
| MAS Active (PVT) Ltd | 11 |
| BISHOFF Gamma | 15 |
| Lanmic Pvt. Ltd | 10 |
| Global Out let | 8 |

| | |
|---|---|
| Sho & Sho | 7 |
| Prime Polymers (Pvt.) Ltd | 6 |

කටුනායක වෙළඳ කලාපයෙහි පැවැති වෛද්‍ය කඳවුරෙහි පහත පරීක්ෂණ සිදුකරන ලදී

| පරීක්ෂණය | සහභාගි වූ ප්‍රමාණය |
|---|---|
| වැඩ කිරීමට ශාරීරික යෝග්‍යතාවය පරීක්ෂා කිරීම | 371 |
| NCD screening | 371 |
| ඇස් පරීක්ෂා කිරීම | 371 |
| පෙනහළු පරීක්ෂාව | 106 |
| කන් පරීක්ෂාව | 75 |
| සම් පරීක්ෂාව | 371 |
| රුධිර පරීක්ෂාව Hb, FBS, SGOT, SGPT | 188 |
| BMI අගය ගණනය කිරීම හා අවවාද ලබා දීම | 371 |
| දන්ත පරීක්ෂාව සහ දත් පිරවීම | 100 |

කටුනායක වෙළඳ කලාපයේ ප්‍රතිඵල පහත පරිදිය

| පරීක්ෂණය | පරීක්ෂණය සඳහා සහභාගි වූ ප්‍රමාණය | හඳුනාගත් සෞඛ්‍ය ගැටලු | ප්‍රතිශතය |
|---|---|---|---|
| වැඩ කිරීම සඳහා ශාරීරික යෝග්‍යතාවය පරීක්ෂා කිරීම | 371 | 2 | 0.5%<br>මීගමු රෝහල වෙත යොමු කිරීම |
| බෝ නොවන රෝග පරීක්ෂා කිරීම | 371 | 18 | 4.8% |
| ඇස් පරීක්ෂාව | 371 | 4 | 1.0% |
| පෙනහළු පරීක්ෂා කිරීම | 106 | 8 | 7.5% |
| කන් පරීක්ෂා කිරීම | 75 | 2 | 2.6% |
| සම් පරීක්ෂා කිරීම | 371 | 18 | 4.8% |

| | | | |
|---|---|---|---|
| රුධිරය පරීක්ෂා කිරීම Hb, FBS, SGOT, SGPT | 188 | 5 | 2.6% |
| දන්ත පරීක්ෂා කිරීම හා දත් පිරවීම | 100 | 77 | 77% |
| BMI අගය ගණනය කිරීම හා අවවාද ලබාදීම | 371 | 105 | 28% |

**NIOSH විසින් සකසන ලද සියලු වෛද්‍ය වාර්තා ආයෝජන ප්‍රවර්ධන කලාපයේ අධ්‍යක්ෂකවරුන් හරහා මානව සම්පත් කළමනාකරුවන්ට ලබාදෙනු ලැබීය.**

සේවකයින්ගේ වැඩකිරීමේ යෝග්‍යතාව හා සෞඛ්‍ය තත්ත්වය වැඩිදියුණු කිරීමේ අරමුණින් වෛද්‍ය කඳවුරු පවත්වනු ලැබීය.

**ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය හා ජාත්‍යයන්තර කම්කරු සංවිධානය විසින් සංවිධානය කළ පුහුණු කරුවන් පුහුණු කිරීමේ වැඩසටහන.**

වසර ගණනාවක් NIOSH බස්නාහිර පළාතේ වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය පිළිබඳ දැනුම බෙදා දුන් අතර ආයතනයට වෙන් කළ සම්පත් නොමැතිකම නිසා අනෙකුත් ප්‍රදේශවලට තොරතුරු සැපයීම අඩු විය. උතුරු හා නැගෙනහිර පළාත්වල වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය පිළිබඳ මූලික දැනුවත් කිරීම් ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය විසින් හඳුනාගෙන සිදුකරන ලදී. ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය ශ්‍රී ලංකීය කාර්මික ප්‍රජාව අතර සුරක්ෂිත සංස්කෘතියක් ඇති කිරීම සඳහා සේවකයින්ට ආරක්ෂිත සේවා පරිසරයක් ඇති කිරීම උදෙසා නිරන්තරයෙන් උත්සහා කරනු ලබයි.

එහි ප්‍රතිඵලයක් ලෙස පුහුණු කරුවන් පුහුණු කිරීමේ වැඩසටහන මඩකලපුව, වව්නියාව යන දිස්ත්‍රිකයන්හි පවත්වන ලදී.කාර්මික හා තාක්ෂණික විද්‍යාලවල උපදේශකවරුන් ඉලක්ක කරගනිමින් උතුරු හා නැගෙනහිර පළාත්වල වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය පිළිබඳ විශේෂ සහතික පත්‍ර වැඩමුළුවක් පැවැත්වූ අතර එහි දී ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ නොමඳ අනුග්‍රහය අප වෙත ලැබුණි. එහි දි ප්‍රධාන වශයෙන් වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පුහුණු පාඨමාලා දින 10ක් පුරා මෙම ස්ථාන ද්වීත්වයන්හි පවත්වන ලදී. ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය හා ජාත්‍යයන්තර කම්කරු සංවිධානයේ අරමුණ වන්නේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ නියැලෙන උපදේශකවරුන් දැනුවත් කිරීම හා සිසුන්හට දැනුම හා පුහුණුව ලබාදෙමින් වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය පිළිබඳ දැනුමක් ලබාදීමය. එමෙන්ම මෙහිදි අලුතින් ආරම්භ වූ කර්මාන්ත ශාලාවල සේවයකරන තරුණ තරුණියන් හට අවශ්‍ය වෘත්තීය සුරක්ෂිතතාව සහ සෞඛ්‍ය පිළිබඳව දැනුවත් කිරීමක් ද සිදුකරනු ලැබීය.

2017 ජූලි මස 27වන දින ආරම්භ කරන ලද පුහුණුවන්නන් පුහුණු කිරීමේ වැඩමුළුවේ වෘත්තීය සුරක්ෂිතතාවය හා සෞඛ්‍ය රෝග පිළිබඳ හඳුන්වා දීමේ වැඩසටහන ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනයේ අධ්‍යක්ෂක ජනරාල්තුමිය විසින් සිදුකරන ලදී.



ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය විසින් අවුරුදු කිහිපයක සිට පුහුණු වීම් කටයුතු හා සංවර්ධන කටයුතුන්හි ප්‍රායෝගීක පුහුණුවක් අවශ්‍ය බව හදුනාගනු ලැබීය. එහි ප්‍රතිඵලයක් ලෙස ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය විසින් ගිනි ආරක්ෂණය පිළිබද උපදෙස් ලබාදෙනු ලැබීය. වව්නියාවේ පැවති මෙම පුහුණුවට ගිනි ආරක්ෂණ නිලධාරින් ගිනි නිවන උපකරණ හා ජල රෝදක යොදාගෙන හදිසි ගින්නක් මැඩ පවත්වන ආකාරය පිළිබද මනා පුහුණුවක් ලබාදෙනු ලැබීය. එමෙන්ම හදිසි ගිනි ගැනීමකදී ගිනි නිවන ආකාරය පිළිබදව ප්‍රායෝගික පුහුණුවක් සහභාගි වූ සියලු දෙනා හට ලැබුණි. ඔවුන් සියලු දෙනාහට අලුත් අත්දැකීමක් හා ඉගැනීම් අත්දැකීම් ලබාගැනීමට මෙම අවස්ථාව මහගු අවස්ථාවක් විය.















සහභාගි වූවන්ට හදිසි අවස්ථාවක දී  සිදුකළ යුතු දෑ පිළිබද ප්‍රමාණවත් දැනුමක් තිබුණි. ඒ අනුව ප්‍රථමාධාර පිළිබදව පුහුණුවක් හා දැනුම සහභාගි වූවන්හට ලබාදුන් අතර හදිසි අවස්ථාවක දී ප්‍රථමයෙන් සිදුකළ යුතු දෑ පිළිබදව අත්දැකීම් සහිතව දැනුම ලබාදෙනු ලැබීමය. එමෙන්ම මෙහිදී පුහුණුවීම් සදහා යොදාගනු ලැබුයේ තාක්ෂණික විද්‍යාලයේ අධ්‍යාපනය ලබන සිසුන්ය. සෑම ප්‍රායෝගික පුහුණුවකටම එම අවස්ථාවේ දීම අවශ්‍ය ප්‍රායෝගික පුහුණුව ලබාදෙනු ලැබීය.








සහභාගි වූ පිරිස් විදුලි ආරක්ෂාව, වෘත්තීය සුරක්ෂිතතාව පිළිබඳව නීතිමය රැකවරණය, සංවෘත්ත ප්‍රදේශවල වැඩ කිරීම, උස් ස්ථානවල වැඩකිරීම, පාරිසරික ආරක්ෂාව සහ රසායනික ආරක්ෂාව පිළිබඳව මනා පුහුණුවක් ලැබීය.







අවසාන වශයෙන් ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය හඳුනාගත් පරිදි උතුරු පළාත්වල සේවයේ නියුතු පිරිස හට පෞද්ගලික ආරක්ෂණ උපකරණ භාවිතය පිළිබඳ දැනුමක් නොමැති බව හඳුනාගනු ලැබීය. උතුරු පළාතේ කර්මාන්ත ක්ෂේත්‍රයේ රැකියාවේ නියුතු සේවකයින්හට අවශ්‍යවන පෞද්ගලික ආරක්ෂණ උපකරණ භාවිතය පිළිබඳ දැනුම මෙම පුහුණුව මගින් දැනුම ලබාගත් තාක්ෂණික විද්‍යාලයන්හි සිසුන් අනාගතයේ දී තාක්ෂණික විද්‍යාලයන්හි පුහුණුවන්නන්හට මෙම පණිවිඩය හා ඔවුන්ට අවශ්‍ය දැනුම ප්‍රචාරය කරනු ලැබේ.



**වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය ක්ෂේත්‍රයේ සමීක්ෂණ සහ පර්යේෂණ**

ජෛව විද්‍යාව පිළිබඳ උපාධි අපේක්ෂකයින් දෙදෙනෙකු වෘත්තීය සෞඛ්‍ය හා ආරක්ෂාව සම්බන්ධයෙන් පර්යේෂණ සිදුකිරීමට මාතෘකා දෙකක් යටතේ තම පර්යේෂණ මාතෘකා ඉදිරිපත්කර ඇත. එම පර්යේෂණ මාතෘකා පහත පරිදි වේ.

**ශ්‍රී ලංකාවේ වෘත්තීය අනතුරු වාර්තාකිරීමේ වර්තමාන අභියෝග සහ අනාගත හැකියාවන් වර්ධනය**

අරමුණ - ශ්‍රී ලංකාවේ වෘත්තීය ආබාධ වාර්තාකරණ ක්‍රමයේ තත්ත්වය තක්සේරු කිරීම

**උපාය මාර්ග**

පහත දැක්වෙන උපාය මර්ග ඉදිරියට කරගෙන යෑම හා පරමාර්ථ සාක්ෂාත්කර ගැනීම සඳහා ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්තුමිය, ගයාන් ගුණතිලක සහ අශේන් සෙනෙවිරත්න යන මහත්ම මහත්මීන් කැපවී කටයුතු කරනු ලැබීය.

- සාහිත්‍ය ගවේෂණය කිරීම මගින් වර්තමානයේ ශ්‍රී ලංකාවේ පවතින වෘත්තීය අනතුරු වාර්තාකිරීම් සිදුවන ක්‍රමවේදය පිළිබද සොයාබලනු ලැබූ අතර ජාත්‍යයන්තර කම්කරු සංවිධානයේ අවශ්‍යතා අනුව වාර්තා කිරීම

- වාර්තා, විද්‍යුත් මූලාශ්‍ර වැනි විවිධ මූලාශ්‍රයන්ගෙන් හදිසි අනතුරු වාර්තාකරණය පිළිබද දත්ත එක් රැස් කිරීම සිදුකරනු ලැබීය.

- පවත්නා තොරතුරු හා දත්ත මත පරතරය විශ්ලේෂණය කිරීම

**ක්‍රමවේදය**


2017 පෙබරවාරි 1වැනි දින ආරම්භ වූ ප්‍රථම කාර්යය වූයේ ශ්‍රී ලංකාවේ දැනට ක්‍රියාත්මක වෙමින් පවතින වාර්තාකරණ ක්‍රියාවලිය පිළිබද අවබෝධයක් ලබාගැනීමය.

**අධ්‍යයනය තුළින් සොයාගත් සොයාගැනීම්**

2017 වර්ෂයේ පෙබරවාරි පළමු දින සිට රජයේ රෝහල්වල ප්‍රතිකාර ලබන වෘත්තීය නිසා අනතුරට පත් වූ අයගෙන් තොරතුරු හා සංඛ්‍යාලේඛන මගින් දත්ත ලබාගැනීම සිදු විය. දැනට ජාතික රෝහලේ පවතින බුලටින මගින් දත්ත ලබාගන්නා ලදී. නමුත් රෝහලේ පවතින නීති හා සදාචාරාත්මක හේතුන් මත තිබෙන වාර්තා මගින් පැහැදිලි දත්ත හා තොරතුරු ලබාගැනීමට නොහැකි විය. දැනට තිබෙන බුලටින (trauma bulletin) මගින් දත්ත ලබාගන්නා ලදී. 2017 අප්‍රේල් 01 වැනි දා සිට 2017 මාර්තු 31 දක්වා කාලය තුල රෝහලෙන් ලබාගත් දත්ත විශ්ලේෂණය කරන ලදී. රෝගීන් සිදුකරන රැකියා අනුව ඔවුන් කාණ්ඩ 9කට වර්ගීකරණය කර ඇත. එනම්, වෘත්තීකයින් (පරිපාලන කටයුතු), හමුදා, ලිපිකාර සේවකයින්, රැකියා විරහිත සේවකයින් (නොබැදි සේවකයින්), කෘෂිකර්මාන්තයේ නියුලුනු අය, සිසුන්, ධීවරයින්, වෙනත් ( නුපුහුණු කම්කරුවන්, සමාජ අනතුරු ආදිය) වශයෙන් බෙදා වෙන්කළ හැක. වෘත්තීය අනතුරු ලබාගත් දත්ත මත 8,774ක් වාර්තා වී ඇත. එක් එක් කාණ්ඩ යටතේ සිදුවන අනතුරු සංඛ්‍යාව පහත දක්වා ඇත.

| පුහුණු ශ්‍රමය | වෘත්තීමය | හමුදාව | ලිපිකරු කාර්ය මණ්ඩය | රැකියා විරහිත | කෘෂිකර්මාන්තය | සිසුන් | ධීවර | අනෙකුත් | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|
| 5,485 | 210 | 143 | 91 | 324 | 15 | 90 | 15 | 2,201 | 8,774 |
| 62.51% | 2.39% | 1.63% | 1.04% | 3.69% | 0.17% | 1.03% | 0.17% | 25.09% | 100% |

**ශ්‍රී ලංකා ජාතික රෝහලෙන් ලබාගත් වෘත්තීය අනතුරු පිළිබද වාර්තාව 2016.04.01 දින සිට 2017.03.21 දක්වා කාල පරිච්ඡේදය තුළ (සියයට ප්‍රතිශතය)**




ඉහත දත්ත ලබාගනු ලැබුයේ රෝගියා රෝහලට ඇතුළත් කළ අවස්ථාවේ ය. රෝගීන් සඳහා වූ පසු වාර්තාවක් නොමැති අතර රෝගියා රෝහලෙන් ඉවත්ව ගිය පසු ඔහු මරණයට පත් වූවාද යන්න සොයා බැලීමට කිසිදු ක්‍රමයක් ස්ථාපිත කර නොමැත.මාරාන්තික කාර්මික තුවාල සිදු වූ සංඛ්‍යාව පිළිබද තොරතුරු ලබාගැනීම සිදුකරනු ලැබුයේ අධිකරණ වෛද්‍ය නිලධාරිගේ කාර්යාලයෙ තිබු වාර්තාවලිනි. මෙය ඉදිරියට ගෙන යනු ලැබුයේ මෙම කාර්යාලයෙන් ලබාගත් තොරතුරු විමර්ශනය කිරීමෙනි. 2017 ජනවාරි මස සිට මාර්තු දක්වා කාල පරිච්ඡේදය තුළ විවිධ වෘත්තීය අනතුරු නිසා සිදුවූ මරණ සංඛ්‍යාව 12ක් ලෙස වාර්තා වී ඇත. එහි තුවාල සිදුවිය හැකි කලාප පිළබදව ප්‍රධාන වාර්තාවක් නොමැති බව අවධාරනණය කල යුතු අතර කෙළඹින් බහැර දිස්ත්‍රිස්ත්‍රික්කයන්ගෙන් රෝගින් ඇතුල්වන බැවින් සංඛ්‍යා ලේඛක විශ්ලේෂණය කිරීමෙ නොහැකියාව පවති.

**නිගමනය**

ඒ අනුව වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය අනතුරු හා රෝග පිළිබද කාලීනව තොරතුරු ලබාගැනීම සඳහා අදාල බලධාරින් විසින් නිසි ක්‍රමවේදයක් සකස් කළ යුතුය.

**දැනුවත් කිරීමේ හා පුහුණු වැඩසටහන්,**

ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනයේ දෛනික වැඩකටයුතු සෞඛ්‍ය හා සුරක්ෂිතතාවය වැඩි දියුණු කිරීම හා සියලු වැඩ ස්ථානවල කම්කරුවන්ගේ ආරක්ෂාව සහතික කිරීමේ අරමුණින් එහි පවත්වයි. NIOSH හි කටයුතු පහත සඳහන් පරිදි සිදුකරන ලදී.

**පාරිසරික සමීක්ෂණ වැඩසටහන්.-**

කර්මාන්තයේ වැඩකරන පාරිසරික ප්‍රමිතින් සහතික කිරීමට ඒවායෙහි උෂ්ණත්වය, අලෝකය, ශබ්දය, වායු, ගෘහස්ත වායු තත්ත්ව ලෙස වැඩකරන පාරිසරික උවදුරු මැනීම සඳහා වගකීම ගනිමින් සිදුකරනු ලබයි. වර්තමානයේ දී NIOSH තම අධීක්ෂණ 183කට වැඩි සේවා ස්ථානයන්හි පාරිසරික අධීක්ෂණ සේවා කටයුතු 2017 වර්ෂය වන විට එක් දක්ෂ කණ්ඩායමක් විසින් සිදුකර ඇත.

**වෛද්‍ය පරීක්ෂණ**

NIOSH කර්මාන්තයේ අවශ්‍යතා අතරින් එකක් වන වැඩ කිරීමට යෝග්‍යතා ශ්‍රමිකයන් පිරිසක් සිටිය ද යන්න පරීක්ෂා කර වෛද්‍ය වාර්තා ලබාදීම ආරම්භ කර ඇත. ඒ අනුව NIOSH ශාරීරික යෝග්‍යතා පරීක්ෂණ එනම්, BMI ගණනය, ශ්‍රවණ පරීක්ෂණ සහ පෙනහළු වල ක්‍රියාකාරිත්වය පරීක්ෂා කිරීම, රුධිර පීඩනය පරීක්ෂාව හා එකතු අනුපාත, අක්ෂි පරීක්ෂණ, රුධිර පරීක්ෂණ ආදි පරීක්ෂණ මාලාවක් සිදු කිරීම අප ආයතනය විසින් සිදුකරනු ලබයි.

**අවධානම් ඇගයීම හා විගණන**

අප ආයතනය විසින් අවධානම ඇගයීම හා කාර්මික වෘත්තීය ආරක්ෂාව සහ සෞඛ්‍ය විගණන පැවැත්වීම හා කර්මාන්තය තුල අබාධවලට ලක්වීම හැකිතාක් අවම කිරීමට උපදෙස් දීම හා නිර්දේශ හදුනාගැනීම හා සැපයීම මේවන විට සිදුකරනු ලබයි.NIOSH විසින් අවධානම් තක්සේරු කිරීමට සහ විගණනය සඳහා නව මෘදුකාංගයක් හදුන්වා දී තිබේ.

- අවධානම් තක්සේරු කිරීමේ වාර්තා සකස් කිරීම සඳහා නව තාක්ෂණය සහාය වී ඇත
    - වාර්තා ලිවීම සඳහා නව තාක්ෂණය හඳුන්වා දී ඇත (i-pad & custom software with customized template)


Occupational Safety & Health
Risk Assessment
conducted for
Ceylinco Life Tower

**වෘත්තීය සුරක්ෂිතතා සතිය තුළ විශ්වවිද්‍යාල සමග සහයෝගයෙන් කටයුතු කිරීම.**

ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය කොළඹ විශ්වවිද්‍යාලයේ මානව සම්පත් කළමනාකරණ පීඨය සහ මොරටුව විශ්වවිද්‍යාලයේ යාන්ත්‍රික ඉංජිනේරු පීඨය සමග එක්ව සුරක්ෂිතතාව පිළිබඳ පුහුණු සැසියක් පැවති අතර මොරටුව විශ්වවිද්‍යාලයේ උපකුලපතිතුමා විසින් ඉතා ඉහළින් අගයකල අතර ඔහුගේ පූර්ණ කැපවීම වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය සංස්කෘතියක් බිහි කිරීමට දායකත්වය ලබාදුන් අතර අපගේ වැඩපිළිවෙල ඉතා ඉහලින් අගය කළේය.

NIOSH විසින් කොතලාවල ආරක්ෂක ඇකඩමියේ උපාධිය අපේක්ෂක සිසුන් සඳහා පුහුණු සැසි කිහිපයක් පවත්වන ලදි.

NIOSH ආයතනය විසින් වෛද්‍ය පශ්චාත් උපාධි ආයතනයට විශිෂ්ඨ සේවාවක් සපයනු ලැබීය.

**ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය සමාජීය වශයෙන් සිදුකල ක්‍රියාකාරකම්.**

රත්නපුර දිස්ත්‍රික්කයේ ගංවතුරට මුහුණපෑමට සිදුවූ ජනතාව සඳහා වෛද්‍ය කඳවුර

පසුගිය සඳුදා ආරම්භ වූ ධාරානිපාත වර්ෂාව හේතුවෙන් පුද්ගලයන් 102දෙනෙකු අතුරුදහන්ව ඇති බව ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය පැවසිය. 75,000කට ආසන්න පිරිසක් සහන කඳවුරු වල රැඳී සිටින බව නිලධාරිහු වාර්තාකරන ලදී.

2003 වර්ෂයේ සිට ශ්‍රී ලංකාව මුහුණ පෑ දරුණුම වර්ෂාව මෙය වේ. කළුතර, රත්නපුර සහ මාතර ප්‍රදේශයන්ට වැඩිම හානි සිදු වී ඇති අතර බටහිර හා දකුණ ප්‍රදේශවල ජලයෙන් යටවී තිබේ. පීඩාවට පත් ජනතාව බේරාගැනීමට යුද හමුදාව ඉදිරිපත් වු අතර ඒ සඳහා බෝට්ටු, ගුවන් යානා ද යොදාගනු ලැබීය.


ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය සහ ජාතික සෞඛ්‍ය අධිකාරිය පීඩාවට පත් ජනතාව සඳහා සහන සැලසීමට කැපවී තම දායකත්වය ලබාදෙනු ලැබීය. ඔවුන්ගේ එදිනෙදා ජීවනෝපාය සාර්ථක කර ගැනීම සඳහා මහගු සේවාවක් සිදු කිරීම සිදුකරන ලදී. ජාතික වෘත්තීය සුරක්ෂිතතා ආයතනය විසින් වෛද්‍ය කඳවුරක් පැවැත්වූ අතර එයට නොමඳ සහයෝගය සබරගමු පළාත් ශ්‍රී ලංකා වෛද්‍ය මණ්ඩලයයේ සහායෝගයද හිමි විය. වෛද්‍යවරුන් 15දෙනෙක්, හෙදියන් කිහිපදෙනෙක් මෙන්ම ඖෂධවේදින් කිහිපදෙනෙකුගෙන් යුක්ත කණ්ඩායමක් මෙම කඳවුරට සහභාගී වී ගංවතුරට ගොදුරු වූවන්හට වෛද්‍යාධාර සැපයීම සිදුකරන ලදී.

1. සියලුම රෝගින්ගේ ශාරීරික පරීක්ෂණ
2. විශේෂිත රෝග තත්ත්වයන් සඳහා ප්‍රතිකාර කිරීම
3. බෝ නොවන රෝගයන්ට මාසයක් සඳහා අවශ්‍ය ඖෂධ වට්ටෝරුවක් ලබා දීම
4. හැකි තරම් විපරම් කිරීම
5. පානීය ජල බෝතල් 500ක් ලබා දීම
6. අවැතැන් වූවන් සිටින කඳවුරු සඳහා දෛනික අවශ්‍යතාවයන් සැපයීම






රත්නපුර දිස්ත්‍රික්කයේ ගංවතුරෙන් ආරක්ෂාවීමට ප්‍රයන්ත දැරූ ජනකායෙන් කොටසක්




පින්තූරය.- සාගර හා වායුගෝලීය පරිපාලන ජාතික ආයතනය - එක්සත් ජනපද වාණිජ දෙපාර්තමේන්තුව

ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනයේ කාර්ය මණ්ඩලය පුද්ගලිකව ඉදිරිපත් වී මුදල් එකතුකර ගංවතුරෙන් අවතැන් පුවන් සඳහා අවශ්‍ය භාණ්ඩ මිළ දී ගත් අතර වෛද්‍ය පණ්ඩුක විජේරත්න මහතා ද ස්වේච්ඡාවෙන් මේ සඳහා දායකත්වය සපයනු ලැබීය. වෛද්‍යවරුන්ගේ සහාය ලබාගැනීම සඳහා ශ්‍රී ලංකා වෛද්‍ය සභාව වෙත දැනුම් දී ඇති අතර මහාචාර්ය චන්ද්‍රිකා විජේරත්න ඇතුළු උපදේශකයන් කිහිපදෙනෙකුගේ සහාය ලැබුණු අතර වෛද්‍යවරු 18 දෙනෙකු මේ සඳහා ස්වේජාවෙන් ඉදිරිපත් විය.

| ස්ථානය | රත්නපුර/බටුගෙදර | මාරපන | පැල්මඩුල්ල / කහවත්ත |
|---|---|---|---|
| NIOSH කණ්ඩායම | NIOSH කණ්ඩායම<br><br>වෛද්‍ය අමරසිංහ මැතිනිය | චරිත්<br><br>විනෝදිනී<br><br>ලක්මාල් | මෝහාන්<br><br>රුවනි<br><br>වසන්ත |

| | | | |
|---|---|---|---|
| | සිතාරා මදූෂානි<br>මදූෂානි<br>ලකෂ්මන් | ගයාන් | |
| වෛද්‍ය කණ්ඩායම | වෛද්‍ය නිපුනි අමරසිංහ<br>වෛද්‍ය ප්‍රමෝද්<br>වෛද්‍ය ලසන්ත | මහාචාර්ය චන්ද්‍රිකා විජේරත්න<br>වෛද්‍ය පාලික | මහාචාර්ය බී. ජේ. සී පෙරේරා |
| ශ්‍රම වාසනා කණ්ඩායම | | | තිලක්<br>රියදුරු |
| සහායක කණ්ඩායම | විහාරා | | කහද |
| **ප්‍රතිඵල** | | | |
| ශාරීරික යෝග්‍යතා පරීක්ෂණ | 172 | 186 | 242 |
| ඖෂධ බෙදා හැරීම | 172 | 186 | 242 |
| හදුනාගත් ගැටලු සියයට ප්‍රතිශතයක් ලෙස | සම හා පාද අසාදන 33%<br>සංසන්ධිතද්‍රය 03%<br>ශ්වසන අබාධ 23%<br>පාචනය 10%<br>වෙනත් සාධක 31% | සම හා පාද අසාදන 45%<br>සංසන්ධිතද්‍රය 00%<br>ශ්වසන අබාධ 33%<br>පාචනය 10%<br>වෙනත් සාධක 12% | සම හා පාද අසාදන 10%<br>සංසන්ධිතද්‍රය 02%<br>ශ්වසන අබාධ 43%<br>පාචනය 5%<br>වෙනත් සාධක 40%<br>(DM/අධිරුධිරපීඩනය) |

**සායන වලින් පසු හදුනාගත් ප්‍රධාන ගැටලු පහත දැක්වේ,**

සියලුම ජංගම සායනයන්ට හයසිය දෙනෙක් සහභාගි වූ අතර අප ආයතනය විසින් සිදුකල මෙය සායනය ඔවුනට අතිශය ප්‍රයෝජනවත් විය. එමෙන්ම 97% කගේ සහභාගීත්වය අප සමග පැවසුවේ එය ඔවුන්ගේ පළමු ජංගම සායනය බවයි. එමෙන්ම ගංවතුරෙන් ආපදාවට පත් වූ පසු ඔවුනට පෞද්ගලිකව වෛද්‍යවරයෙකු මුණ ගැසීමේ අවස්ථාව හා ඖෂධ ලබාගැනීමට හැකි වූයේ අප ආයතනය විසින් පැවැත් වූ වෛද්‍ය සායනය මගිනි. කෙසේ නමුත්, පැල්මඩුල්ල ප්‍රදේශයේ රජයේ වෛද්‍ය නිලධාරි සමහර ස්ථානවලට ගොස් තත්ත්වය සොයා බලා අවශ්‍ය ප්‍රතිකාර ලබා දී ඇත.

වෛද්‍ය සායනය සදහා සෑම වයස් කාණ්ඩයකින්ම සහභාගි වූ අතර 14.5% (73) වයස අවුරුදු 10 ට අඩු විය. පැල්මඩුල්ල ප්‍රදේශයෙන් වයස අවුරුදු 10 ට අඩු වැඩිම දරුවන් සංඛ්‍යාවක් සායන සදහා සහභාගි විය. ඉතා සුළු ගර්භනී මව්වරුන් සායන සදහා සහභාගි විය. ( සායන පැවැත්වු ස්ථාන ත්වීත්වය සදහා සහභාගි වූයේ ගර්භනී මව්වරුන් 10ක් පමණි.

බෝ නොවන රෝගී තත්ත්වයන් සඳහා වයෝවෘද්ධ රෝගීන් විවිධ ගැටලුවලට මුහුණ දී සිටි අතර දින කිහිපයක් යන තෙක් ඔවුන්ගේ රෝග සඳහා ඖෂධ ගැටලුවකට ඔවුන් මුහුණ දී සිටියේය. එනම් ගංවතුරට ඔවුන්ගේ ඖෂධ හසු වී තිබීම නිසා දින කිහිපයක් ඖෂධ නොමැතිව සිටි ඔවුනට නියමිත ඖෂධ ලබා දීම සිදුකරන ලදී. (සායනික පොත ගංවතුරට ලක්විය).

ගැහැණු ළමුන් හා කුඩා දරුවන්ගේ සනීපාරක්ෂක අවශ්‍යතා ඉතා ඉතා අඩු තත්ත්වයේ තිබුණ අතර එම පහසුකම් ඔවුනට ලබා දිය යුතු වූ අතර අප විසින් එම අවශ්‍යතා කිහිපයක් සම්පූර්ණ කරන ලදී.

එමෙන්ම ගංවතුර ආපදා තත්ත්වය ඔවුනට විදුලිය අහිමිකල අතර විදුලි සැපයීම යථා තත්වයට පත්කරන තෙක් ඔවුනට අවශ්‍ය ආලෝක තත්ත්වය ලබාගැනීම සඳහා ඉටිපන්දම්, ගිනිපෙට්ටි ආදිය ඔවුනට ලබාදීම සිදුකලේ ආපදාවට ලක් වූවන් සඳහා විදුලි ආලෝකය ද මූලික අවශ්‍යතාවයක් වන බැවිනි.

**ඇගයීම**

මෙය ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය විසින් සිදුකල ඒකාබද්ධ උත්සහායක් වූ අතරම ශ්‍රී ලංකා වෛද්‍ය සංගමයේ නොමද සහයෝගය මේ සඳහා ලබාදෙනු ලැබීය. ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් වෛද්‍ය චම්පිකා අමරසිංහ මහත්මියගේ විශේෂ ගෞරව ස්තුතිය වෛද්‍ය කඳවුර සඳහා සහභාගි වූ විශේෂඥ වෛද්‍ය චන්ද්‍රිකා විජේරත්න , වෛද්‍ය ප්‍රමෝද් සහා වෛද්‍ය ලසන්ත වනිගතුංග යන විශේෂ වෛද්‍ය කණ්ඩායමට හිමි වේ.

ජාතක ආපදාවක දී ආපදාවට පත් වූ ජනතාවට ඔවුන්ගේ අපරිමිත සේවාව සපයා එම කාර්යය සාර්ථක කර ගැනීම සඳහා නොමද සහයෝගයක් ලබා දුන් ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනයේ කාර්ය මණ්ඩලයට විශේෂ ස්තුතිය හිමි වේ.

**වෘත්තීයමය පුනරුත්ථාපනය හා වෘත්තීය නිසා ආපදාවට ලක් වූ ආබාධිත අය සඳහා කෘතිම අත්පා ලබාදීම.**

වෘත්තීයමය හදිසි අනතුරක් හේතුකොටගෙන වෘත්තීයමය වශයෙන් අබාධිත තත්ත්වයට පත් වූවන් නැවත රැකියාවේ යෙදීමට අවශ්‍ය වතාවරණයක් ඇතිකිරීම මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වේ. ශ්‍රී ලාංකීක නිෂ්පාදකයෙකු විසින් නිෂ්පාදනය කරන ලද ඉතා නම්‍යශීලි කෘතිම පාද අබාධිත පුද්ගලයින් 15දෙනෙකු සඳහා ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය විසින් සිදුකරන ලදී. මෙම පාද හා අත්පා භාවිතයට ඉතා පහසු වන අතර නැවත ඔහු අබාධිත තත්ත්වයට පත්වීමට පෙර සිදුකල රැකියාව සිදුකිරීමට හැකියාව සලසේ. එදින සහභාගි වූ සියලු කම්කරුවන් හට පරිත්‍යාග කරන ලද කෘතිම පාද පරිත්‍යාගශීලි විසින් පරිත්‍යාග කරන ලදී.


 

**තොරතුරු තාක්ෂණය මත පදනම්ව NIOSH කළමනාකරණ පද්ධතිය ස්ථාපිත කිරීම.**

NIOSH ආයතනය මොරටුව විශ්වවිද්‍යාලය සමග එකට ඒකාබද්ධව තොරතුරු තාක්ෂණය පදනම් වූ කළමනාකරණ පද්ධතියක් දියුණු කිරීමට හැකියාව ලැබුණු අතර එය අප ආයතනයේ ඩිප්ලෝමා පාඨමාලා හදාරන පුහුණුවන්නන්ගේ තොරතුරු ඇතුළත් කිරීමට හැකියාව ඇත. එමෙන්ම එය නිසියාකාරව දත්ත ඇතුළත් කරමින් යාවත්කාලීන කිරීම ද සිදු කරනු ලබයි.

**වෙබ් අඩවිය අලුත්වැඩියා කිරීම**

NIOSH හට වෙබ් අඩවිය අලුත්වැඩියා කිරීම සිදු කල අතර නව ධාරිතාවකින් ද එය යුක්ත වේ.




## ISO 9001

NIOSH හට ISO 1900/2015 ලබාගත් අතර වර්තමානයේ කළමනාකරණ පද්ධතිය දිවෙනුයේ මෙය පදනම්කරගනිමින්ය.


BUREAU VERITAS
Certification

# National Institute of Occupational Safety & Health (NIOSH)

NIOSH
National Institute of Occupational Safety and Health - Sri Lanka

NO 97, JAWATHTHA ROAD, COLOMBO 05, SRI LANKA.

*Bureau Veritas Certification Holding SAS – UK Branch certifies that the Management System of the above organization has been audited and found to be in accordance with the requirements of the Management System standard detailed below.*

*Standard*

**ISO 9001:2015**

*Scope of certification*

**PROVIDING HEALTH AND SAFETY TRAINING COURSES, CONDUCT HS AUDITS AND SUPPORT SERVICES**

| | |
|---|---|
| Original cycle start date: | **04 October 2017** |
| Expiry date of previous cycle: | **NA** |
| Certification Audit date: | **02 October 2017** |
| Certification cycle start date: | **04 October 2017** |

Subject to the continued satisfactory operation of the organization's Management System, this certificate expires on: **03 October 2020**

Certificate No. **IND17.5852U/Q** Version: **1** Revision date: **04 October 2017**

***Signed on behalf of BVCH SAS UK Branch***
***Ramesh KOREGAVE***
***Director, CERTIFICATION***
***South Asia Region***

UKAS MANAGEMENT SYSTEMS
0008


*Certification body address:* *5th Floor, 66 Prescot Street, London, E1 8HG, United Kingdom*

*Local office:* *Bureau Veritas (India) Private Limited (Certification Business) "Marwah Centre" 6th Floor, Krishanlal Marwah Marg, Opp. Ansa Industrial Estate, Off Saki Vihar Road, Andheri (East), Mumbai – 400 072, India.*

*Further clarifications regarding the scope of this certificate and the applicability of the management system requirements may be obtained by consulting the organization. To check this certificate validity please call* ***+91 22 6695 6300.***

NIOSH පැතිකඩ

**NIOSH** පැතිකඩ දියුණු කිරීමට හැකියාව 2017 වර්ෂය තුළ දී හැකියාව ලැබුණු අතර එය අප සේවාවන් හා පාඨමාලාවන් පිළිබඳව අනෙක් අය දැනුවත් කිරීමට මාධ්‍යක් ලෙස භාවිත කරනු ලබයි.





**ආයතනික ස්ථාවරත්වය හා එහි වර්ධනය**

ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය ප්‍රධාන කර්මාන්ත අතර වෘත්තීය සෞඛ්‍ය හා ආරක්ෂාව පිළිබඳව සැපයුම්කරු වශයෙන් ප්‍රධාන වෙළඳ නාමයක් ලෙස සලකනු ලබන අතර අප රටෙහි ප්‍රධාන වෙළඳ නාමයක් ලෙස අප ආයතනයේ නාමය ප්‍රචාරණයකරනු ලබන්නෙමු.


**2011 වසරේ සිට 2016 වසර දක්වා NIOSH සේවා සැපයීම ප්‍රගතිය**





2011 වසරේ දී කර්මාන්ත 33ක් පමණ ආවරණය වන පරිදි සේවා සැපයීම බස්නාහිර පළාතට සීමා විය.





2012 වසරේ දී කර්මාන්ත 60ක් පමණක් ආවරණය වන පරිදි සේවා සැපයීම බස්නාහිර පළාත හා මධ්‍යම පළාතට සීමා විය.




2013 වසරේ දී කර්මාන්ත 90ක් පමණ ආවරණය වන පරිදි සේවා සැපයීම බස්නාහිර, මධ්‍යම, දකුණ,උතුරු මැද, වයඹ පළාතට ව්‍යාප්ත විය.




2015-2016 දී කර්මාන්ත 500ක් පමණ ආවරණය වන පරිදි දිවයිනේ දිස්ත්‍රික්කයන් විශාල ගණනක් ආවරණය වන පරිදි අපගේ සේවාවන් ව්‍යාප්ත කිරීමට හැකි විය.




2017 වර්ෂය වන විට ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය සිය සේවාවන් දිවයින පුරා ව්‍යාප්ත කර ඇත.

**වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳ අධ්‍යනය සඳහා වූ පුස්තකාලය**

ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතන පරිශ්‍රයේ බිම් මහලේ වෘත්තීය සුරක්ෂිතතාවය සම්බන්ධව ප්‍රයෝජනවත් පොත්පත් රාශියක් පුස්තකාලය සතු වේ. පහත සඳහන් විෂයන් පිළිබඳ පොත්පත් වාර සඟරා, පත්‍රිකා, වාර්තා, නිබන්ධන, පූර්ණ මුද්‍රණ, මොඩියුල, රසායනික ආරක්ෂණ දත්ත සටහන් පත්‍ර, දත්ත පාඨක පුවත්පත් ලිපි ආදිය සම්බන්ධව අධ්‍යනය කරන සිසුන්ගේ පරිශීලනය සඳහා සතියේ දින වල විවෘතව ඇත.

- වෘත්තීය සෞඛ්‍යය
- කර්මාන්ත
- පාරිසරික
- මහජන
- වැඩකිරීමට සුදුසු පරිසරය
- කාර්මික ආරක්ෂාව
- රසායනික ආරක්ෂාව
- වෘත්තීය රෝග
- කර්මාන්ත නීති සම්පාදනය
- විෂ විද්‍යාව
- ජලය සහ සනීපාරක්ෂාව

**NIOSH කාර්ය මණ්ඩලය**







## ආයතනයේ මූල්‍ය ප්‍රගතිය

ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය 2011 වසරේ දී වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය සම්බන්ධව සේවා කටයුතු ආරම්භ කල අතර 2017 වන විට මූල්‍යම වශයෙන් ගුණාත්මක ප්‍රගතියක් වාර්තාකර ඇති අතර 2017 වර්ෂයේ දී වෘත්තීය සුරක්ෂිතතාව සම්බන්ධව ආදායම් ප්‍රභවයන්ගෙන් ලබාගෙන ඇති මෙහෙයුම් ආදායම 53,890,612.50වූ අතර එය පසුගිය වර්ෂය හා සැසඳීමේ දී 11%ක ප්‍රගතියක් පෙන්නුම්කරයි. 2017 වර්ෂයේ මෙහෙයුම් වියදම මිලියන 37,576,993.92 වූ අතර පසුගිය වාර්ෂය හා සැසඳීමේ දී වියදම වැඩි වී ඇත්තේ 4.6%වැනි සුළු ප්‍රමාණයකිනි.

පසුගිය වර්ෂ හතෙහි මූල්‍ය ප්‍රගතිය පහත ප්‍රස්ථාරයෙන් දැක්වේ.




## <u>මූල්‍ය විශ්ලේෂණ 2016 - 2017</u>

| | 2016 | 2017 |
|---|---|---|
| වෘත්තීය සුරක්ෂිතතා පාඨමාලා වලින් ලද ආදායම | 13,420,433.00 | 19,293,425.00 |
| පාරිසරික මිනුම් වලින් ලද ආදායම | 9,380,900.00 | 10,987,630.00 |
| වෙනත් ආයතනය සමග ඇතිකරගත් සහයෝගීතා ගිවිසුම් තුලින් සපයනු ලැබූ සේවා සදහා ලබාගත් ආදායම | 3,363,933.75 | 5,209,602.15 |
| වෛද්‍ය පරික්ෂණ කටයුතු තුළින් ලද ආදායම | 1,753,550.00 | 4,399,492.00 |
| වෘත්තීය සෞඛ්‍ය සුරක්ෂිතතා සතිය තුළින් ලද ආදායම | 15,352,750.00 | 4,927,400.00 |
| පොළී ආදායම | 4,979,759.00 | 8,673,883.60 |
| NIOSH සමාජිකත්ව ආදායම | - | 85,500.00 |
| වෙනත් ආදායම් | 247,308.00 | 313,679.25 |
| එකතුව | <u>48,498,633.84</u> | <u>53,890,612.00</u> |

## මූල්‍ය තත්ත්වය ප්‍රකාශය

ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය

2017 දෙසැම්බර් 31 වන දිනට

**ශේෂ පත්‍රය**

| | | 2017 | 2016 |
|---|---|---|---|
| වත්කම් | | රු. | රු. |
| ජංගම වත්කම් | | | |
| මුදල් හා මුදල් සමාන දෑ | Note 1 | 9,306,905.65 | 4,458,171.75 |
| ලැබිම් | Note 2 | 11,771,304.84 | 14,223,633.35 |
| සංවර්ධන අරමුදල | | 80,802,152.99 | 59,950,019.76 |
| | | 101,880,363.48 | 78,631,824.86 |
| **ස්ථාවර වත්කම්** | | | |
| භාණ්ඩාගාර තැම්පතු | | 267,500.00 | 267,500.00 |
| දේපල පිරියත හා උපකරණ | Note 3 | 21,630,307.50 | 21,137,628.38 |
| | | 21,897,807.50 | 21,405,128.38 |
| **මුළු සංචිත** | | 123,778,170.98 | 100,036,953.24 |
| **වගකීම්** | | | |
| ජංගම වගකීම් | | | |
| ගෙවිම් | Note 5 | 1,997,414.53 | 1,997,414.53 |
| මුළු වගකීම් | | 1,997,414.53 | 1,997,414.53 |
| **ශුද්ධ වත්කම්** | | 98,039,538.71 | 98,039,538.71 |
| අතිරික්ත ආදායම | Note 4 | 115,695,761.08 | 92,206,989.71 |
| භාණ්ඩාගාර ලැබීම් | Note 6 | 2,028,664.39 | 4,182,549.00 |
| වෛද්‍ය උපකරණ පරිත්‍යාග - ජාතික වෛද්‍ය අරමුදල | | 990,000.00 | 1,650,000.00 |
| **මුළු ශුද්ධ වත්කම්** | | 98,039,538.71 | 98,039,538.71 |

**ආදායම් ප්‍රකාශය**

ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

ආදායම් ප්‍රකාශය

| ආදායම | **2017** | **2016** |
|---|---|---|
| භාණ්ඩාගාර ලැබීම් | 2,220,827.79 | 3,200,000.00 |
| මෙහෙයුම් ආදායම | 53,890,612.50 | 48,498,633.84 |
| | 56,111,440.29 | 51,698,633.84 |

(-)

| වියදම් | | |
|---|---|---|
| ආයතන පරිපාලන වියදම් | 34,148,114.14 | 31,771,349.69 |
| මූල්‍ය වියදම් | 293.25 | 21,381.88 |
| ක්ෂය | 3,428,586.53 | 4,104,282.61 |
| **මුළු වියදම්** | 37,576,993.92 | 35,897,014.18 |
| **වර්ෂයේ අතිරික්තය** | **18,534,446,37** | **15,801,619.99** |

## ගිණුම්වලට අදාළ සටහන් - ගිණුම්කරණ ප්‍රතිපත්ති

මූල්‍ය ප්‍රකාශනවලට සටහන්

**1 . වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති**

**1.1** වාර්තා කරන ආයතනය

ශ්‍රී ලංකාවේ කම්කරු සබඳතා හා මිනිස්බල අමාත්‍යාංශය යටතේ වන ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය 2005 අප්‍රේල් 28 වැනි දින ස්ථාපිත කරන ලදී. ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය, නිසි සෞඛ්‍ය හා ආරක්ෂිත පියවර පිළිබඳ දැනුවත්භාවය සහ බැඳියාව වැඩි කිරීම තුළින් සියලු දෙනා සඳහා යහපත් වැඩ පරිසර තත්ත්වයන් ඇති කිරීමට කැපවී සිටියි. මෙම ආයතනය කොළඹ - 05, ජාවත්ත පාරේ අංක 97 දරන ස්ථානයේ පිහිටා තිබේ.

**1.2** ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙහෙයුම්වල ස්වභාවය

යෝග්‍ය සෞඛ්‍ය සහ ආරක්ෂණ නීතිරීති පිළිබඳ දැනුවත්භාවය සහ බැඳියාව වැඩි කිරීම තුළින් සියලු දෙනා සඳහා යහපත් වැඩ පරිසර තත්ත්වයන් ඇති කිරීමට ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය කැපවී සිටියි. මෙම ක්‍රියාකාරකම්වලට යාවත්කාලීන කරනු ලැබූ තොරතුරු බෙදා හැරීම සහ උපදේශක හා උපදේශන සේවා ඇතුළත්වේ. මෙම ආයතනය මගින් සිදුකරනු ලබන පුහුණු කිරීම් තුළින් ප්‍රතිලාභ ලැබිය හැකි සේව්‍යයන්, සේවකයන් හා වෙනත් සියලුම ගණයන්හි ජනතාව දැනුවත් කිරීම සහ පුහුණු කිරීම මෙන්ම වෘත්තීය ආරක්ෂාව සහ සෞඛ්‍යය පිළිබඳ ක්ෂේත්‍රයේ විමර්ශන අධ්‍යයන, සමීක්ෂණ සහ පර්යේෂණ සඳහා ආයතනය සහයෝගය දක්වයි.

**1.3** පිළියෙළ කිරීමේ පදනම

(අ) අනුකූලතා ප්‍රකාශය

මෙම ආයතනයේ මූල්‍ය ප්‍රකාශලවලට ශේෂ පත්‍රය, ආදායම් ප්‍රකාශය, ස්කන්ධ වෙනස්කම් පිළිබඳ ප්‍රකාශය, මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය සහ මූල්‍ය ප්‍රකාශනවලට සටහන් ඇතුළත් වේ. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය (ICASL) විසින් පනවා ඇති කුඩා ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට ( SLASSE) අනුකූලව මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කොට තිබේ.

(ආ) මිනුම් පදනම

ඓතිහාසික පිරිවැය පදනම මත මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කොට තිබේ. මූල්‍ය ප්‍රකාශනවල උද්ධමන සාධක සඳහා කිසිදු ගැලපීමක් සිදුකර නැත.

(ඇ) සක්‍රිය සහ ඉදිරිපත් කරන ව්‍යවහාර මුදල්

මෙම මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරනු ලබන්නේ ආයතනික ව්‍යවහාර මුදල් වන ශ්‍රී ලංකා රුපියල් වලිනි.

## 2. දේපළ, පිරියත හා උපකරණ

*i.* හඳුනාගැනීම හා මැනීම

භාණ්ඩ විෂයයන් දේපළ, පිරියත හා උපකරණ මනිනු ලබන්නේ පිරිවැයෙන් සමුච්චිත ක්ෂයවීම් අඩු කිරීම සහ සමුච්චිත ක්ෂයවීම් සහ සමුච්චිත හානිවීම්වලින් සිදුවන අලාභ පදනම් කරගෙනය.

යන්ත්‍ර සූත්‍රයකට සහ උපකරණයකට අයත් භාණ්ඩ විෂයයක පිරිවැයට ඇතුළත් වන්නේ එය මිලදී ගත් වටිනාකම සහ එය අපේක්ෂිත ආකාරයෙන් ක්‍රියාත්මක කිරීම සඳහා එකී වත්කම ක්‍රියාකරවීමට ඍජුව දරන ලද පිරිවැයයි.

කිසියම් දේපළකට, යන්ත්‍ර සූත්‍රයකට හෝ උපකරණයකට අයත් භාණ්ඩ විෂයයක උපාංගයක් ප්‍රතිස්ථාපනය කිරීම සඳහා දරන ලද වියදම් වෙන වෙනම ගිණුම්ගතකොට තිබේ නම්, උපාංගය පිළිබඳව ඉදිරියට ගෙන යන කපාහළ වියදම්වලට ප්‍රාග්ධනීකරණය කරනු ලැබේ. ඉන්ඉක්බිතිව කරනු ලබන වියදම් ප්‍රාග්ධනීකරණය කරනු ලබන්නේ දේපළ, පිරියත හා උපකරණවලට අන්තර්ගත අනාගත ආර්ථික ප්‍රතිලාභ එමගින් වැඩිවන්නේ නම් පමණි. සෙසු වියදම් දරනු ලැබූ පරිද්දෙන් වේ.

*ii.* ක්ෂයවීම්

වත්කමේ ප්‍රයෝජනවත් ජීව කාලයට අනුව ඍජු රේඛා පදනමක් මත ආදායම් ප්‍රකාශය තුළ ක්ෂයවීම් හඳුනා ගැනේ.

ප්‍රවර්තන හා සංසන්දනාත්මක කාල සීමා සඳහා ඇස්තමේන්තු කරන ලද ප්‍රයෝජ්‍ය ආයුකාලයන් පහත දැක්වේ.

| | අවුරුදු |
|---|---|
| යන්ත්‍ර කට්ටල හා යන්ත්‍ර සූත්‍ර | 10 |
| පරිගණක උපකරණ | 5 |
| ලීබඩු සහ සවිකිරීම් | 10 |
| ශබ්ද පද්ධති අයිතම | 5 |
| වෛද්‍ය උපකරණ | 10 |
| වෙනත් වත්කම් | 10 |

මිලදී ගත් අවුරුද්ද තුළ ක්ෂයවීමක් සිදු නොකෙරෙන අතර අපහරණය කරන වර්ෂයේදී ඊට සම්පූර්ණ ක්ෂයවීමක් ඇතුළත් වේ.

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } එල්/ඊඩබ්/එන්අයිඕඑස්එච් /1/17

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2018 අගෝස්තු 31 දින

සභාපති
ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳ ආයතනය.

**ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳ ආයතනයේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳ ආයතනයේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2009 අංක 38 දරන ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳ ආයතන පනතේ අංක 17(3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2) සී වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් ආයතනයේ සභාපති වෙත 2018 ජුනි 08 දින නිකුත් කරන ලදී.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.



අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, .- இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை.- No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 ag@auditorgeneral.gov.lk www.auditorgeneral.gov.lk

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදි. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාල වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණණ සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳ ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය සහ මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය සහ සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) **ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) පිරිවැය රු.937,760 ක් වූ ගෘහ උපකරණ සහ වෛද්‍ය උපකරණ සමාලෝචිත වර්ෂයේදී රු.429,000 කට ප්‍රත්‍යාගණනයක් සිදුකර එම ප්‍රත්‍යාගණිත අගය වත්කම් එකතු කිරීම් ලෙස දක්වා තිබුණද එම වත්කම්වල පිරිවැය හා සමුච්චිත ක්ෂය හඳුනාගෙන ගිණුම්වලින් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ii) ප්‍රමිතයේ 43 වන ඡේදය ප්‍රකාරව දේපල පිරියත හා උපකරණවල සාධාරණ වටිනාකම වෙළඳපල අගය මත ඇගයීමකින් නිශ්චය කරනු ලබන අතර ඒ සඳහා පිළිගත් හා අදාළ වෘත්තීය සුදුසුකම් ඇති, තක්සේරු වෘත්තියේ සාමාජිකයෙකු විසින් වත්කමක අගය තක්සේරු කල යුතු බව දක්වා තිබුණද ආයතනයේ වත්කම් ප්‍රත්‍යාගණනයේදී එසේ විධිමත් සුදුසුකම් වලින් යුක්ත කමිටුවක් විසින් ප්‍රත්‍යාගණනය සිදුකර නොතිබුණි.

(iii) ප්‍රමිතයේ 49 ඡේදය ප්‍රකාරව දේපළ, පිරියත හා උපකරණ අයිතමයන් ප්‍රත්‍යාගණනය කිරීමේදී එම වත්කම අයත්වන දේපළ, පිරියත හා උපකරණ පන්තිය මුළුමනින්ම ප්‍රත්‍යාගණනය කළයුතු වුවද වත්කම් පන්ති දෙකක රු.මිලියන 15.7 ක් පිරිවැය වූ අයිතමයන් සමබන්ධයෙන් ප්‍රමිතය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(iv) ප්‍රමිතයේ 90 ඡේදය ප්‍රකාරව දේපළ, පිරියත හා උපකරණ පන්තියක් ප්‍රත්‍යාගණනය කළ විට උක්ත ප්‍රමිතියේ "අ" සිට "උ" දක්වා කළයුතු හෙළිදරව් කිරීම් සිදුකර නොතිබුණි.

**(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 2**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) සමාලෝචිත වර්ෂය සඳහා සේවක පාරිතෝෂික වෙන්කිරීම රු.312,393 ක් වුවද එය රු.250,278 ක් ලෙස මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ගැලපීම් කර තිබුණි.

(ii) එකතුව රු.772,400 ක් වූ පෙර වර්ෂ ගැලපීම් සමාලෝචිත වර්ෂයේ ආදායමට ගැලපීම් කර නොතිබුණද මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මූල්‍ය නොවන ගැලපීම් යටතේ ගැලපීම් කර තිබුණි.

(iii) මූල්‍ය බලපෑමක් නැතිව ආයතනයට ප්‍රදාන වශයෙන් ලැබුණු වෛද්‍ය උපකරණය සඳහා වර්ෂ 04 ක කපා හැරීම් රු.660,000 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ කාරක ප්‍රාග්ධන ගැලපීම් යටතේ වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ හි අඩුවීම් ලෙස ගලපා තිබුණි.

(iv) දේපල පිරියත හා උපකරණ මිලදී ගැනීම සඳහා සමාලෝචිත වර්ෂයේදී වැයකර තිබූ මුදල රු. 3,997,265 ක් වුවද මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ පිරියත හා උපකරණ අත්පත් කර ගැනීම් ලෙස ගෘහභාණ්ඩ ප්‍රත්‍යාගණිත අගය වූ රු. 89,000 ක්ද ඇතුළත්ව රු. 4,086,265 ක් දක්වා තිබුණි.

(v) වර්ෂයේ පොලී ආදායම වූ රු.8,673,884 ක් අතිරික්තයට ගලපා නොතිබුණු අතර මුදලින් ලද පොළී ආදායම වන රු.1,372,664 ක් ආයෝජන ක්‍රියාකාරකම් යටතේ මුදල් ගලා ඒමක් ලෙස දැක්වීම වෙනුවට මුදල් ගලා යාමක් ලෙස දක්වා තිබුණි.

### 2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනය සඳහා 2013 වර්ෂයේ ජාතික විද්‍යා පදනමින් ලැබූ රු. 1,650,000 ක පරිත්‍යාග ගිණුම්ගත කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේ නව ගිණුම්කරණ ප්‍රතිපත්තියක් යොදාගෙන තිබුණද එය මූල්‍ය ප්‍රකාශන තුළින් හෙළිදරව් කර නොතිබුණු අතර ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 හි 34 වන ඡේදය ප්‍රකාරව ස්ව කැමැත්තෙන් ගිණුම්කරණ ප්‍රතිපත්තියක් භාවිත කිරීමේදී ප්‍රවර්ථන කාලපරිච්ඡේදයට හෝ පෙර කාලපරිච්ඡේදයට හෝ බලපෑමක් වේ නම් එයද හෙළිදරව් කළයුතු වුවත් එසේ සිදුකර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කර තිබුණු මූල්‍ය ප්‍රකාශන අනුව පිරියත හා යන්ත්‍රවල ප්‍රයෝජනවත් ජීවිත කාලය වසර 10 ක් ලෙස දක්වා තිබුණද ක්ෂය ගණනය කිරීමේදී ජීවිත කාලය වසර 5 ක් ලෙස සලකා ක්ෂය ගණනය කිරීම කර තිබුණි.

(ඇ) ආයතනය සඳහා 2017 වාර්ෂික ඇස්තමේන්තුවෙන් අයභාර වියදම් සඳහා රු. 2,220,827 ක් ද ප්‍රාග්ධන වියදම් සඳහා රු.2,028,664 ක් ද වශයෙන් භාණ්ඩාගාර ප්‍රතිපාදන ලබා දී තිබුණ ද එම මුදල් ගිණුම්ගත කිරීම පිළිබඳව රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 හි 12 ඡේදය ප්‍රකාරව ගිණුම්කරණ ප්‍රතිපත්තීන් හඳුනාගෙන හෙළිදරව් කර නොතිබුණි.

### 2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

----------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වටිනාකම රු.288,403 ක්වූ Air Sampling - Pumbs model Gil Air 3RC යන වෛද්‍ය උපකරණය 2015 මැයි 15 දින ක්‍රමාංකනය කිරීම සඳහා රු.188,700 ක මුදලක් වැයකර තිබූ අතර එය අදාල වත්කමට ප්‍රාග්ධනිත කර තිබුණද සමාලෝචිත වර්ෂය දක්වා එකතුව රු.75,480 ක ක්ෂය ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) පුනරාවර්ථන වියදම් වෙනුවෙන් භාණ්ඩාගාරය විසින් 2017 වර්ෂයේ ප්‍රතිපූර්ණය කරන ලද රු.308,188 ක පුනරාවර්ථන ප්‍රදානයන් ප්‍රාග්ධන ප්‍රදානයන් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඈ) සුළු මුදල් වලින් වැයකරන ලද රු.15,975 ක් සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙස ගිණුම්ගත කර නොතිබුණු අතර එම හේතුවෙන් වර්ෂයේ ලාභය එම අගයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඉ) ආයතනය සඳහා 2013 වර්ෂයේ ජාතික විද්‍යා පදනමින් ලැබූ රු 1,650,000 පරිත්‍යාග ගිණුම් ගත කිරීමේදී සමාලෝචිත වර්ෂයේ රු.165,000 ක පරිත්‍යාග කපාහැරීම වෙනත් ආදායමක් ලෙස ගිණුම්ගත කිරීම වෙනුවට ක්ෂය වෙන්කිරීම් ගිණුමට බැරකර තිබුණි.

(ඉ) රජයේ ප්‍රදාන උපචිත මත ගිණුම් තැබීම හේතුවෙන් අමාත්‍යාංශයෙන් ලැබිය යුතු ශේෂයක් ලෙස රු.3,628,340 ක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වත්කම් යටතේ දක්වා තිබුණි.

## 2.3 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම නොවන වත්කම් යටතේ භාණ්ඩාගාර ගිණුම ලෙස රු. 267,500 ක ශේෂයක් 2010 වර්ෂයේ සිට වර්ෂ 07 ක කාලයක් පුරා නිරවුල් කිරීමකින් තොරව පැවතුණි. එම මුදල මුදල් අමාත්‍යාංශයෙන් ලබාගැනීමට නොහැකි බැවින් ඉදිරියේදී කපා හැරීමට කටයුතු කරන බව සභාපති විසින් විගණනය වෙත දන්වා තිබුණි.

(ආ) මූල්‍ය ප්‍රකාශන අනුව සේවාදායකයින්ගෙන් ලැබුණු රු.204,137 ක අත්තිකාරම් මුදලක් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් අදාල සේවාව සැපයීමට හෝ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. මෙම අත්තිකාරම් මුදල් නිරවුල් නොකිරීමේ කාල ප්‍රමාදය මාස 12 - 30 දක්වා පරාසයක විය.

(ඇ) 2012 ජනවාරි 01 දින සිට 2013 දෙසැම්බර් 31 දක්වා වසර දෙකක කාලයක් සඳහා කම්කරු දෙපාර්තමේන්තුවෙන් මුදා හැර තිබූ නිලධාරියා මෙම ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරිය ලෙස කටයුතු කර තිබූ අතර වැටුප් සඳහා ගෙවන ලද රු.1,170,996 ක මුදල නැවත කම්කරු දෙපාර්තමේන්තුවට ප්‍රතිපූර්ණය කරන ලෙස ඉල්ලා තිබුණි. ඒ අනුව 2013 වර්ෂයේ දී මෙම මුළු වැටුප් වියදම සඳහා වෙන් කිරීමක් සිදුකර තිබූ නමුත් වර්ෂ 05 ක කාලයක් ගතවී තිබුණද මෙම බැරකම නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.18,534,446 අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.15,801,620ක් විය. ඒ අනුව ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 2,732,826 ක වර්ධනයක් නිරීක්ෂණය විය. වර්ෂයේ මෙහෙයුම් ආදායම රු.5,391,978 කින් ඉහළ යෑම ඉහත වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂ හතරක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2014 වර්ෂයේදී රු.19,441,777 ක්වූ අතිරික්තය 2017 වර්ෂය වනවිට රු.18,534,446 දක්වා අඩු වී තිබුණි. සේවක පරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා වන ක්ෂය ප්‍රතිපාදන සැලකිල්ලට ගැනීමෙන් පසු අරමුදලේ සමස්ථ දායකත්වය 2013 වර්ෂයේදී රු.17,104,796 ක් වූ අතර 2015 වර්ෂයේදී රු.12,721,122 දක්වා පිරිහීමකට ලක්ව තිබුණි. කෙසේ නමුත් සමාලෝචිත වර්ෂයේදී එය රු.28,918,806 ක් දක්වා වර්ධනය වී පැවතුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

#### 4.1.1 සැලසුම් කිරීම

ආයතනය විසින් 2017 – 2022 කාලසීමාවන්ට අදාලව සංයුක්ත සැලැස්මක් පිළියෙල කර තිබුණු අතර ආයතනයේ ස්ථාපිත අරමුණු ඉටුකර ගැනීම සඳහා ව්‍යාපාරය තුළ පවතින ශක්තීන්, දුර්වලතා හා ව්‍යාපාරික පරිසරයේ ඇති අවස්ථාවන් සහ බාධක පිළිබඳ ඇගයීමට ලක්කර නොතිබුණි.

#### 4.1.2 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2009 අංක 38 දරන ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍යය පිළිබඳ ආයතන පනතේ 3 (1) ඌ වගන්තිය ප්‍රකාරව වෘත්තීය ආරක්ෂණ හා සෞඛ්‍යයට අදාල වන තොරතුරු එකතු කිරීම ,සකස් කිරීම,ව්‍යාප්ත කිරීමට භාර ගැනීම හා එයට සහය දැක්වීම පරමාර්ථයක් වුවද එවැනි ක්‍රියාමාර්ග ආයතනය විසින් ක්‍රියාවට නංවා නොතිබුණි.

(ආ) එම පනතේ 3(1) ග වගන්තිය ප්‍රකාරව වෘත්තීය ආරක්ෂණ හා සෞඛ්‍ය ක්ෂේත්‍රය පිළිබඳ ජාතික ප්‍රමිත පිහිටුවීම පරමාර්ථයක් වුවද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එවැනි ජාතික ප්‍රමිත භාවිතයේ නොතිබුණි.

### 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

ආයතනය විසින් ජාත්‍යන්තර කම්කරු සංවිධානය සමඟ ඇති කරගෙන තිබූ ගිවිසුම අනුව ශ්‍රී ලංකාවේ උතුරු නැගෙනහිර පළාත් සඳහා වෘත්තීය ආරක්ෂණය සහ සෞඛ්‍ය සම්බන්ධ හැකියා සංවර්ධන පුහුණු වැඩසටහනක් සමාලෝචිත වර්ෂය තුළදී පවත්වා තිබුණි. එසේ වුවද වැඩසටහන වෙනුවෙන් රු.1,375,326 ක් වියදම් දරා තිබූ අතර ඉතිරි මුදල වූ රු.924,063 ක් ප්‍රේෂණය කිරීමකින් තොරව ආයතනයේ ආදායමක් ලෙස හඳුනා ගෙන තිබුණි. එම වැඩසටහන සඳහා ජාත්‍යන්තර කම්කරු සංවිධානය වෙතින් රු.2,229,389 ක් ලැබී තිබූ අතර ගිවිසුම් 4.6 ඡේදය ප්‍රකාරව වැඩසටහන නිමකිරීමෙන් අනතුරුව භාවිත නොකර ඉතිරිවන මුදලක් වේ නම් එම සංවිධානය වෙත නැවත යැවිය යුතු විය.

### 4.3 විධිමත් පරිදි පවරා නොගත් ඉඩම්/දේපලවල ව්‍යාපෘති ආරම්භ කිරීම

ආයතනය පවත්වාගෙන යන අංක 97 ජාවත්ත පාරේ පිහිටි ඉඩම හා ගොඩනැගිල්ලේ අයිතිය 2007 ජුනි 08 වන දින කම්කරු දෙපාර්තමේන්තුවේ කර්මාන්ත සුරක්ෂිතා අංශය වෙත පවරා දී තිබුණි. 2017 ජුනි 30 දිනය වන විටත් එම වත්කම් විධිමත් පරිදි ආයතනය වෙතට පවරාගැනීමට කටයුතු කර නොතිබුණු අතර එසේ අයිතිය පවරා ගැනීමකින් තොරව එහි ප්‍රාග්ධන වියදම් ලෙස සමාලෝචිත වර්ෂයේදී රු.1,121,965 ක මුදලක් ද පසුගිය වර්ෂයේදී රු.5,644,437 ක් ද වැයකර තිබුණි.

### 4.4 කාර්ය මණ්ඩල පරිපාලනය

ආයතනය පිහිටුවා වසර 09 ක් ගත වුවද කාර්මණ්ඩල පුරප්පාඩු දීර්ඝකාලීනව පැවතුණු අතර සමාලෝචිත වර්ෂය අවසානයේදී ජ්‍යෙෂ්ඨ කළමනාකරණයේ තනතුරු 04 ක් ද, මෙහෙයුම් මට්ටමේ තනතුරු 04 ක් ද වශයෙන් පුරප්පාඩු 08 ක් පැවතුණි.

## 5. තිරසාර සංවර්ධනය

### 5.1 තිරසර සංවර්ධන අරමුණු ළඟා කරගැනීම

තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 " න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කල යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාලව ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳ ආයතනය විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න දැනුවත් වී නොතිබුණි. එම නිසා එහි කාර්යයන්ට සම්බන්ධ තිරසාර සංවර්ධන අරමුණු , ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟා වියයුතු සන්ධිස්ථානයන් ද ඉලක්ක මත ළඟාවීම මැන බැලීම සඳහා වන දර්ශකයන් ද හඳුනාගැනීමට කටයුතු කර නොතිබුණි.

## 6. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 6.1 ප්‍රසම්පාදන සහ කොන්ත්‍රාත් ක්‍රියාවලිය

#### 6.1.1 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනයේ ප්‍රවාහන අවශ්‍යතාවය සඳහා සුඛෝපභෝගී වෑන් රථ සහ කාර් රථ කුලියට ගැනීම වෙනුවෙන් මිල ගණන් කැඳවා තිබුණද ලංසු ඇගයීමේදී ආයතනයේ ප්‍රවාහන අවශ්‍යතාවය සඳහා "නැනෝ කැබ් සේවාව" ප්‍රමාණවත් බව පසුව තීරණය කර තිබු අතර ඒ සඳහා එක් ලංසුවක් පමණක් ලැබී තිබුණි. ඒ අනුව ආයතනයට හොඳම මිලට (Best price) සේවාව සපයා ගැනීමට තිබු අවස්ථාව අහිමි වී තිබුණි.

(ආ) 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.3.2 ඡේදය ප්‍රකාරව ප්‍රමාද වී ලැබෙන ලංසු භාර නොගත යුතු අතර ලංසු විවෘත නොකර ආපසු යැවිය යුතුය. සමාලෝචිත වර්ෂයේදී ආයතනය සඳහා වටිනාකම රු.150,000 ක්වූ ජංගම හිමොග්ලොබින් විශ්ලේෂණ යන්ත්‍ර (Portable Hemoglobin Analyzers) 03 ක් සහ එකක් රු.65 බැගින් වූ ස්ට්‍රිප් (Strip) 600 ක් මිල දී ගැනීමේදී මිල කැඳවුම් ලේඛනවල සඳහන් පරිදි ලංසු ඉදිරිපත් කලයුතු අවසාන දිනට පසු දිනයකදී මිල ගණන් ඉදිරිපත් කර තිබූ ආයතනයකින් අදාල භාණ්ඩ මිල දී ගෙන තිබුණි.

## 7. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ  අවධානය යොමුවිය යුතුය.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | ආදායම හඳුනාගැනීම | • ඉන්වොයිසි නිකුත් කිරීමකින් තොරව ආදායම් හඳුනාගත් අවස්ථා පැවතීම. |
| (ආ) | කාර්ය මණ්ඩල පරිපාලනය | • ආයතනයේ අරමුණ ඉටුකර ගැනීමට අත්‍යාවශ්‍ය වැදගත් පුරප්පාඩු පිරවීමට කටයුතු නොකිරීම. |
| (ඇ) | තොරතුරු තාක්ෂණ පොදු පාලනයන් | • ආයතනය සතුව වෘත්තීය අනතුරු සම්බන්ධව දත්ත පද්ධතියක් ස්ථාපිත කර පවත්වා නොගැනීම. |
| (ඈ) | ප්‍රසම්පාදන ක්‍රියාවලිය | • ලංසු විවෘත කිරීමේ දිනය, වේලාව, ස්ථානය සහිතව ලංසු කැඳවීමේ ලේඛන සකස් කර නොතිබීම.<br>• ලංසු විවෘත කිරීම සඳහා කමිටුවක් පත්කර අනුමත කර නොතිබීම.<br>• ලංසු විවෘත කිරීම වාර්තා කිරීමට ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ නියමිත ආකෘතිපත්‍ර භාවිතා කර නොතිබීම. |

එච්.එම්.ගාමිණී විජේසිංහ
විගණකාධිපති